## 2019/08/13 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2019/08/13 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 8. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 10. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 11. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 12. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 13. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 14. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 16. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | බී.ජී.අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**සහභාගී නොවූ**

| | | |
|---|---|---|
| **01.** | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |

### 01. ආගම සිහි කිරීම

2019.08.13 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සුභ උදෑසනක් වේවා සියලුම දෙනාට. උප සභාපතිතුමා ඇතුළු පැමිණ සිටින සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉතා ගෞරවයෙන් පිළිගනිමින්, 2019 අගෝස්තු මාසයට අදාල සැසි වාරය ආරම්භ කිරීමට බලාපොරොත්තු වෙනවා. පෙර සභාවල පරිදිම ඔබ සියළු දෙනාගේ සහයෝගය මම ඉතා ගෞරවයෙන් අපේක්ෂා කරනවා.

**(අ)01. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

නැත

**(අ)02. 2019.07.09 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

2019.07.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස **ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ආ). සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

නැත

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් 2020 සඳහා අයවැය සකස් කිරීම සම්බන්ධව 2019.07.23 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය ගාල්ල විසින් රාජ්‍ය ,සංස්ථා, මණ්ඩල, අධිකාරි සහ ව්‍යවස්ථාපිත ආයතනවල තනතුරු දරණ පළාත් පාලන ආයතනවලට තේරී පත්වූ/ පත් කල සභික මන්ත්‍රීවරුන් සම්බන්ධව දේශපාලන කටයුතු සඳහා රාජකාරී නිවාඩු ලබා ගැනීම සම්බන්ධව 2019.07.05 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මෙ සම්බන්ධව පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා විසින් අදාළ මන්ත්‍රීවරුන්ට දන්වා සිටියේ , නීත්‍යානුකූලභාවය රැක ගැනීම සඳහා අදාළ ලේඛනයේ අත්සන, දිනය, කාරණය සටහන් කිරීමට කාරුණික වන ලෙසයි.

03. තල්ගස්වල නියාගම පද්මසිරි හි පදිංචි කාරියවසම් හපුතන්ත්‍රීගමගේ ආනන්ද පද්මසිරි සහ කාරියවසම් හපුතන්ත්‍රි ගමගේ මහින්ද පද්මසිරි යන පැමිණිලිකරුවන් විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට එදිරිව උඩුගම දිසා අධිකරණයේ නඩු අංක එල් /36 දරණ නඩුවට අදාළ සිතාසිය හා ඒ සම්බන්ධ පැටිගිරිය සභාගත කරන ලදි.

මෙ සම්බන්ධව පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, ගෝණදෙනිය අපි භුක්ති විදින ඉඩමට මෙම නඩුව දමා ඇති බවත්, රු. 100000.00 කට ආසන්න මුදලක් එම පිට්ටනිය වෙනුවෙන් වියදම් කල බවත්, මෙ සම්බන්ධව නීතීඥ මහතා සමඟ සාකච්ඡා කරන බවත්ය.

මේ පිළිබඳව, ගරු මන්ත්‍රී අජිත් එඬේරආරච්චි මහතා, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, දීර්ඝව කරුණු ඉදිරිපත් කරන ලදී.

04. ගා.දි.අ.නඩු අංක පී 15977 නඩුව සම්බන්ධව නීතිඥ හේමන්ත විතාරණ මහතා විසින් 2019.07.31 දිනැතිව යොමු කරන ලද නඩු ගාස්තු ලිපිය සභාගත කරන ලදී.

05. 2019.06.27 දින පවත්වන ලද වාහන වෙන්දේසිය සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කිරීම, සංවර්ධන නිලධාරී යුරේකා මල්කාන්ති මහත්මිය විසින් යොමු කරන ලද 2019.08.05 දිනැති වාර්තාව සභාගත කරන ලදී.

06. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් විමධ්‍යගත සංවර්ධන සැළැස්ම - 2019 සම්බන්ධව යොමු කරන ලද 2019.07.31 දිනැති ලිපිය සභාගත කරන ලදී.

07. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් ගම්පෙරලිය වැඩසටහන - 2019 මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධව යොමු කරන ලද 2019.08.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.

08. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන - 2019 සම්බන්ධව යොමු කරන ලද 2019.08.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.

09. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ විශේෂ වැඩසටහන - 2019 සම්බන්ධව යොමු කරන ලද 2019.07.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

10. ජාතික විගණන උප කාර්යාලය, ගාල්ල විසින් යොමු කරන ලද 2018 වර්ෂය සඳහා විගණන ගාස්තු බිල් කිරීම සම්බන්ධව 2019.06.18 දිනැති ලිපිය සභාගත කරන ලදී.

11. මාර්ගයට ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සම්බන්ධව යූ.ජී. ප්‍රසන්න, නෙත්සිත්, ගෝණදෙනිය, ගා/උඩුගම විසින් 2019.06.20 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

12. දකුණු පළාත් සභා මන්ත්‍රී, කේ.පී.ජී. සිසිර කුමාරරත්න මැතිතුමා විසින් ඔහුගේ ප්‍රතිපාදන යටතේ මාර්ග සංවර්ධනය කිරීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

13. සාසනාලංකාරාරාමය, උඩුගම නැගෙනහිර, යතිවර රාවය සංවිධානය මගින් නාගොඩ සම්මන්ත්‍රන ශාලාව ලබා ගැනීම සඳහා යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, මෙම වැඩසටහන හොඳ වැඩසටහනක් බැවින්, අපි ඒ පැය කිහිපයට අපේ සම්මන්ත්‍රන ශාලාව නොමිලේ ලබා දෙමු යනුවෙනි.

14. මාපලගම කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, යටලමත්ත විසින් මනෝවිද්‍යාත්මක උපදේශන වැඩසටහනට ශ්‍රවනාගාරය නොමිලේ ලබා ගැනීම සඳහා යොමු කරන ලද 2019.08.13 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව පැහැදිලි කරමින් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, ළමයින්ගේ වැඩසටහනක් නිසා අපි ඒ සඳහා ශාලාව නොමිලේ ලබා දෙමු. එහෙමනම්, මේ වැඩසටහන් දෙකටම ශාලාව නොමිලේ ලබාදීමට කටයුතු කරනවා යනුවෙනි.

15. රජයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරී සංගමය විසින් රාජකාරියට පැමිණීම හා පිටවීම සඳහා ඇඟිලි සළකුණු තැබීම සම්බන්ධව 2019.07.20 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

මේ ඉල්ලීම ඉටු කිරීමට අපහසු බවත්, වෛද්‍යාතුමිය බස් 03ක එන බැවින් ප්‍රමාද වන බව, ප්‍රකාශ කලද, අපට ඒක අදාළ නැති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කල අතර, මේ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා, ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා, මෙම ඉල්ලීම ඉටු කල නොහැකි බව දක්වමින් අදහස් දක්වන ලද අතර, වෙනත් සභාවලින් විමසා බලන ලෙස ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා කියා සිටි අතර, ගරු සභාපතිතුමා දන්වා සිටියේ නෙළුව සභාවෙන් විමසූ බවත්, එම සභාවේ ඇගිලි සළකුණු තබන බව දැන්වූ බවත්, අනිත් සභාවලිනුත් විමසා බලා මේ සම්බන්ධව තීරණයක් ගමු යනුවෙනි.

16. ඩී.එන්.ගමගේ, සහන, උඩුගම නැගෙනහිර, ගා/උඩුගම, ප්‍රාදේශීය සභා පුස්තකාල සඳහා පොත් මිළදී ගන්නා ලෙස ඉල්ලීම සම්බන්ධ 2019.08.10 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, ප්‍රාදේශීය සභා පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීමට කටයුතු කිරීම සුදුසු බවයි. ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා සහ ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින් කියා සිටියේ පොත් කට්ටල දෙක බැගින්වත් පුස්තකාල සඳහා පොත් මිළදී ගැනීම සුදුසු බවයි.

17. සුමිත් ශාන්ත උඩුගමවිතාන, නැහිනිගල, ඌරල විසින් ඌරල නැහිනිගල මාර්ගය සංවර්ධනය කිරීමේදී ඇතිවූ අක්‍රමිකතාවයක් දැණුම් දීම සම්බන්ධ 2019.07.23 දිනැති ලිපිය සභාගත කරන ලදී

18. සුමිත් ශාන්ත උඩුගමවිතාන, නැහිනිගල, ඌරල විසින් ඌරල නැහිනිගල මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මාගේ විරෝධතාවයක් නොමැති බව දැණුම් දීම සම්බන්ධ 2019.07.24 දිනැති ලිපිය සභාගත කරන ලදී.

මෙහිදී අදාළ ඉංජිනේරු මහතා සහ කොන්ත්‍රාත්කරු අතර සුහදතාවයක් ඇති කරගෙන කල යුතු වැඩක් බවත්, අපට මේකට කල හැකි දෙයක් නොමැති බවත්, කෙසේ වෙතත්, ඒ පුද්ගලයාට සාධාරණයක් ඉටු කරන එක වටිනා බවත්, ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින් කියා සිටියේ, ගරු සභාපතිතුමා මෙම ප්‍රශ්නය පිළිබඳ දන්නා බවත්, මෙහි දේශපාලන අරමුණක් නැති බවත්, පැහැදිලි කරමින් දීර්ඝව අදහස් දැක්වූ අතර ගරු සභාපතිතුමා කියා සිටියේ ඔහුට වාචිකව පාර අවශ්‍ය බව පැහැදිලි කර දුන් බවත්, නමුත් එය කරපු විදිහ අනුමත නොකරන බවත්ය.

19. එච්.කේ. භාග්‍යා සඳමාලි, දිමුතු පෙර පාසල, හඟරන්වල, නාකියාදෙණිය විසින් පෙර පාසල් නිවාඩු කාලය සඳහා දීමනා ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද 2019.08.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

20. එම්.කේ. සංජීවනී තිළිණි කුමාරි, රන්කැකුළු පෙර පාසල, උඩුගම නැගෙනහිර, ගා/උඩුගම විසින් නිවාඩු මාස තුලදී දීමනා ලබා දෙන මෙන් ඉල්ලීම සම්බන්ධව යොමු කරන ලද 2019.08.09 දිනැති ලිපිය සභාගත කරන ලදී.

21. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය, ගාල්ල විසින් උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යා කරන මාර්ගය සම්බන්ධව ගාල්ල දිසා අධිකරණයේ පවතින එල් 15888 දරණ නඩුව සම්බන්ධව උපදෙස් ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

22. ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී බී.ජී. අරුණ ශාන්ති මහත්මිය විසින් ගෙවතු වගා තරඟය ජයග්‍රාහකයින් සඳහා අනුග්‍රාහකත්වයක් ලබා ගැනීම සම්බන්ධව 2019.08.10 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

23. ගරු සම්පත් අතුකෝරල මැතිතුමා විසින් නාගොඩ ප්‍රාදේශීය සභාවට 2018 වර්ෂයේ ලබා දී ඇති මන්ත්‍රී ප්‍රතිපාදන මුදල් වලින් උඩවැලිවිටිතලාව ක්ෂේත්‍රාරාම විහාරස්ථානටුද්‍රව්‍ය ලබා දීම සඳහා රු. 25000.00 ක මුදලකුත්, නාගොඩ ස්වශක්ති සුභසාධක සමිතිය සඳහා අමුද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් රු. 15000.00කුත් ලබා දෙන ලෙස ඉල්ලීම් කර යොමු කරන ලද ගරු සම්පත් අතුකෝරල මැතිතුමාගේ ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**නැත.**

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

i. නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා අලුතින් ෆැක්ස් යන්ත්‍රයක් මිළදී ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

ii. 2017 වර්ෂයේ දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රජා ශාලා හා බහු කාර්ය ගොඩනැගිලි හා ඉදිකිරීම් සඳහා ද්‍රව්‍ය ලබා දීම වෙනුවෙන් වෙන්ව ඇති මුදලින් නාගොඩ ස්වශක්ති සමිතියට සිමින්ති කොට්ට 15 ක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

iii. 2019 ඔක්තෝම්බර් 01 වන දින මාපලගම මහජන ක්‍රීඩාංගනයේදී ලෝක ළමා දින උත්සවය පැවැත්වීම සඳහා අනුමැතිය ලැබී ඇති රු. 150000.00 ක මුදල ප්‍රමාණවත් නොවන බැවින් අමතරව, තවත් රු. 150000.00 ක මුදලක් සභා අරමුදලින් දැරීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදී. පැවැත්වීමට යෝජිත වැඩසටහන සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා, ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා යන මන්ත්‍රීවරුන් අදහස් දක්වමින් එම වැඩසටහනට විරෝධතාවය ප්‍රකාශ කළේය. මෙම යෝජනාව පිළිබඳ ගරු සභාපතිතුමා විසින් සභාවේ අදහස් විමසන ලද අතර ඉහත නම් සඳහන් මන්ත්‍රීවරුන් හැර අනිත් මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත යෝජනාව සභා සම්මත විය.**

iv. සභා බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය කිරීම සඳහා ලියාපදිංචි සමිතිවලට ලබා දීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

v. ප්‍රාදේශීය ලේකම් සතු අක්කර 05 ක භූමි ප්‍රමාණයෙන් යුතු උඩුගම ඇප්තොප්වත්ත ඉඩම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා විධිමත්ව පවරා ගැනීමට යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

- **ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා තම බිරිඳ රෝහල් ගත වී සිටින බැවින්, ඇය බැලීම සඳහා පිටව යාමට අවසර ලබා දෙන ලෙස ඉල්ලා සභාවෙන් බැහැර යන ලදී.**

- **සභාවේ වැඩ කටයුතු මෙතැන් සිට විනාඩි 05 කට කල් තබන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැණුම් දෙන ලදී. නැවත අදාළ කාල සීමාවෙන් පසු සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.**

vi. උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානයේ ජල බිල්පත සඳහා රු. 51003.59 ක් ගෙවීමට ඇති අතර එය නොගෙවා හැරීම හේතුවෙන් 2019.07.23 දින ජල සැපයුම විසන්ධි කර ඇත. එබැවින් ඉහත සඳහන් මුළු මුදල ගෙවා නැවත ජල සැපයුම ලබා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය**

vii. කැබලි කර විකුණන ඉඩමක් සඳහා සංවර්ධන බලපත්‍රයක් ලබා දීමේදී නාගොඩ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණ අංශය,මගින් ගරු මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති වාර්තාවේ සඳහන් පොදු කරුණු සපුරා තිබීම සුදුසු බව යෝජනා කරමි.

මෙහිදී දීර්ඝ වශයෙන් මේ පිළිබඳව සාකච්ඡා වූ අතර, එහිදී ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ, සංශෝධනයන්ට යටත්ව මෙම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසයි.

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ඉහතින් දක්වන ලද සංශෝධනයන්ට යටත්ව ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

viii. **ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 43 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීමට යෝජනා කරමි.**

<u>2019.08.13 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>

**01.2019 ජූලි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 2813038709 | - කැකුළු පෙර පාසල | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 258.30 |

**02. 2019 ජූලි මස දුරකථන ගාස්තු ගෙවීම - ශ්‍රී ලංකා ටෙලිකොම්**

| | | |
|---|---|---|
| 0912296537 | - ප්‍රධාන කාර්යාලය ( සභාපතිතුමා) | - රු. 4339.64 |
| 0912296433 | - ප්‍රධාන කාර්යාලය | -රු. 9697.28 |

**03. සී/ස ලංකාබෙල් පුද්ගලික සමාගම**

උප සභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත පියවීම (2019.06.16- 2019.07.15) - රු. 688.50

**04. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතියේ කෙටි පණිවිඩ සේවාවේ බිල්පත පියවීම (2019.07.25) - රු. 68.86

**05. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරුන්ගේ ආහාර සාම්පල් ලබා ගැනීමේ බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම

| | | |
|---|---|---|
| යූ.කේ. ජයන්ත මයා | (නාගොඩ කොට්ඨාසය) | - රු. 1000.00 |
| යූ.කේ. ජයන්ත මයා | (ගම්මැද්දේගොඩ කොට්ඨාසය) | - රු. 1000.00 |

ii. රාජකාරි අවශ්‍යතා සඳහා PF 7360 කැබ් රථය අධිවේගී මාර්ගයේ ගමන් කිරීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු. 2350.00

**<u>06. අතිකාල දීමනා ගෙවීම</u>**

**<u>2019 ජුනි මස</u>**

| | | |
|---|---|---|
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු.9053.96 |

**<u>2019 ජූලි මස</u>**

| | | |
|---|---|---|
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 8031.00 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු.7075.50 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු.7680.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු.9176.26 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු.8360.00 |
| එන්.එම්.රජිත මයා | -අනියම් මුරකරු | - රු.8080.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර | - අනියම් රියදුරු | - රු.8360.00 |
| කේ.ජී. ලෙස්ලි සිරිවර්ධන මයා | - විදුලි කාර්මික | - රු. 2901.00 |
| පී.කේ. චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 2376.00 |

**<u>07 .2019 ජූලි මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 6200.00 |
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | -ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | -සංවර්ධන නිලධාරී | - රු. 6200.00 |

**08. 2019 ජූලි මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන | - ගරු සභාපති | - රු. 5000.00 |
| සී. දයාවංශ මිය | - ලේකම් | - රු. 2000.00 |
| දිලිනි දිසානායක මිය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 910.00 |
| කේ.ඒ. ජයනි මිය | - සංවර්ධන නිලධාරී | - රු. 530.00 |
| පී.ඩී. යුරේකා මල්කාන්ති මිය | - සංවර්ධන නිලධාරී | - රු. 405.00 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහාකාර | - රු. 405.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1188.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 4200.00 |
| ඉරේෂා මල්කාන්ති මදනායක | - සංවර්ධන නිලධාරී | - රු.430.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| එන්.එච්.ඩී. නිරෝෂනි | - කළමනාකරණ සහකාර | - රු. 1752.00 |
| එච්.එම්.හේවාවිතාන මෙය | - කළමනාකරණ සහාකාර | - රු. 3520.00 |
| ඩබ්.ජේ.ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1760.00 |
| යසරත්න විජේසේකර | - මුරකරු | - රු. 880.00 |
| කේ.කේ. අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 2628.00 |
| චමරි මධුෂානි | - කාර්යාල කාර්ය සහායක | - රු. 2640.00 |

**09. 2019 අගෝස්තු මස ගමන් වියදම්**

**ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| සී. දයාවංශ මිය | - ලේකම් | - රු. 2384.00 |

**පුහුණු වැඩසටහන් සඳහා**

| | | |
|---|---|---|
| කේ.ඒ. ජයනි මිය | - සංවර්ධන නිලධාරී | - රු. 2820.00 |

**10. යූ.කේ.ජයන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/07/19) - රු. 600.00

**11. එච්.ඩබ්. ප්‍රියන්ත මයා, ම.සෞ.ප**

I. ආහාර සාම්පල් පරීක්ෂාවට කළුතර ජාතික සෞඛ්‍යායතනයට යාම වෙනුවෙන් ගෙවීම (2019.07.29) - රු. 800.00

II. ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම වෙනුවෙන් ගෙවීම (2019/07/19) - රු. 504.00

**12. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිඟ විගණන ගාස්තු ගෙවීම - රු. 10000.00

**13.සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමූපකාර සමිතිය**

**2019 ජූනි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**

| | |
|---|---|
| RA 8569 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 84 ක් | - රු. 8736.00 |
| RA 8570 ට්‍රැක්ටරය ඩීසල් ලීටර් 35 ක් | - රු. 3640.00 |
| **එකතුව** | **- රු. 12376.00** |

**14.** **ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**
**<u>2019 ජූලි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්</u>**

| | |
|---|---|
| PF 7360 කැබ්රථය ඩීසල් ලීටර් 600ක් | - රු. 62400.00 |
| LL 7103 ටිපර් රථය ඩීසල් ලීටර් 225 ක් | - රු. 23400.00 |
| 252-6478 කැබ් රථය ඩීසල් ලීටර් 180 ක් | - රු. 19760.00 |
| LL 7650 කෘ කැබ් රථය ඩීසල් ලීටර් 115 ක් | - රු. 11960.00 |
| ජලභීතිකා රෝග මර්ධනය සඳහා ගමන් කරන ලද රථයට ගෙවීම් ඩීසල් ලීටර් 70 | - රු. 7280.00 |
| තණකොළ කපන මැෂිම සඳහා පෙට්‍රල් ලීටර 20 | - රු. 2760.00 |
| 2 T oil ලීටර 1 | - රු. 620.00 |
| **එකතුව** | **- රු.128180.00** |

**15.ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2019 අගෝස්තු මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු.28500.00
ii. 2019 ජූලි මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2100.00

**16.ඒ.ඩී. කරුණාරත්න මයා ,සරත් ස්ටෝර්ස්, යටලමත්ත**
නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2019 ජූලි - රු. 7090.00

**17.මහජන බැංකුවේ ලංකා විදුලිබල මණ්ඩලය,**
උඩුගම නැගෙනහිර රන් කැකුළු පෙර පාසල සඳහා විදුලිය ලබා දීමේ ඇස්තමේන්තු මුදල ගෙවීම - රු. 19765.16

**18.** **අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**
i. PF 7360 දරණ කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.16220.00

**19**. **දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ**
2019.04.01 සිට 2019. 06.30 කාර්තුවට අය කර ගත් මුද්දර බදු ප්‍රේෂණය කිරීමේ ගාස්තු - රු. 4425.00

**20**. **රෙජිස්ටාර් ජෙනරාල්,ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය,බලපිටිය** -රු. 100.00
2018 ජූලි මාසයට මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනාව

**21.** **නිව් විජය මෝටර්ස්, ගාල්ල**
PF 7360 දරණ කැබ් රථය සඳහා ටයර් 04 ක් මිළදී ගැනීමේ බිල්පත - රු.134720.00

**22.** **එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා අගෝස්තු මස මාසික කුලීය ගෙවීම - රු. 4000.00

**23.එම්.වී. නාමල් ලක්රුවන් මයා,ගෝනදෙණිය**
ඇප්තොප් කසල වල අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 21500.00

**24.රෙජිස්ටාර් ජනරාල්, ඉඩම් රෙජිස්ටාර් කාර්යාලය, අවිස්සාවේල්ල**
2017 ජූලි සැප්තැම්බර් මාසවල උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් ගාස්තු ගෙවීම - රු. 200.00

**25.ඒ.ජේ.ජී ස්ටේෂනරිස්, ගාල්ල**
I.ප්‍රධාන කාර්යාලය සඳහා අවශ්‍යා ලිපිද්‍රව්‍යා මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු. 21652.50
II.ප්‍රධාන කාර්යාලය සඳහා A4 මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු. 10950.00

**26.පී. එල්. රංජන් මයා, ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල**
මාසික මහා සභා රැස්වීම සඳහා රබර් මුද්‍රාවක් සකස්කර ගැනීමේ බිල්පත - රු. 450.00

**27.දුලාන් දුමින්ද මයා , තල්ගස්වල**
2019 වර්ෂයේ තල්ගස්වල බදාදා සති පොළ වෙනුවෙන් ටෙන්ඩර් තැන්පතුව ආපසු ගෙවීම- රු. 15000.00

**28. ඊ.ඒ. එස්. කේ. එදිරිසිංහ මයා, එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**
i. RA 8569 ට්‍රැක්ටරයේ යතුරු ස්විච්, හෙඩ් ලයිට්, බල්බ් සවි කිරීමේ බිල්පත - රු. 2150.00
ii. RA 8570 ට්‍රැක්ටරයේ බ්‍රේක් ලයිනර් සෙට්, ලයිට් ස්විච් සවි කිරීමේ බිල්පත - රු. 5750.00

**29. ගෙස්ටෙට්නර් සිලෝන් පී.එල්.සී, කොළඹ 02**
ප්‍රධාන කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රයට ටෝනර් ලබා ගැනීමේ බිල්පත - රු. 17090.00
ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමේ බිල්පත -රු. 37202.50

**30. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**
වීථි පහන් අළුත්වැඩියාවට තම්බ්ලර් ස්විච් 100 ක් ලබා ගැනීම - රු. 14000.00

**31. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**
සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2019 ජූලි) - රු.13000.00

**32. දසමස් වැටුප් අත්තිකාරම් ගෙවීම්**
යූ.ජී.රංජිත් උදයකුමාර මයා - රු.226420.00

**33. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, ගා/ නාගොඩ**
i. 2019 ජූලි මස 11 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (තේ සඳහා) - රු. 2790.00

**34. ආර්. ඒ. රංජිත් මානෙල් මයා, සීගිරි හොටෙල්, නාගොඩ**
i. 2019 ජූලි මස 09 පැවති මහ සභා රැස්වීමට අදාල සංග්‍රහ වියදම් බිල්පත (කෑම සඳහා) - රු.2760.00

**35. මුතුහෙට්ටිගම ටයර් සෙන්ටර්, උඩුගම**
RA 8569 ට්‍රැක්ටරයේ රෝදය සඳහා පැච් දැමීමේ බිල්පත - රු. 750.00

**36. දයානි පුද්ගලික සමාගම, මාපලගම**
I. මාපලගම ආයුර්වේදය, වෙළද සංකීර්ණය, පුස්තකාලයේ ජල පද්ධතිය අළුත්වැඩියා කිරීම බිල්පත රු.8710.00
II. තල්ගස්වල පොළ භූමියේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 4040.00
III. මාපලගම වෙළද සංකීර්ණයේ විදුලි පද්ධතිය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 4390.00
IV. මාපලගම වෙළද සංකීර්ණයේ ජල මෝටරය අළුත්වැඩියා කිරීමේ බිල්පත - රු. 625.00

V. මාපලගම ක්‍රීඩාපිටිය හා සති පොළ සඳහා පැඩ් ලොක්, ග්ලාස් කටර් ලබා ගැනීමේ බිල්පත - රු. 1625.00

VI. මාපලගම පුස්තකාලයට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත - රු. 300.00

**37.ජී.පී.සහන් චතුරංග,ඊබේස් කම්පියුටර් ටෙක්නොලොජි, ගාල්ල**

පරිගණක යතුරු පුවරුවක් ලබාගැනීමේ බිල්පත පියවීම -රු.650.00

**38. ග්‍රෑන්ඩ් මෝටර්ස්, වඳුරඹ**

PF 7360 කැබ්රථය බ්‍රේක් පෑඩ් යොදා අලුත්වැඩියා කිරීමේ බිල්පත -රු.11850.00

**39. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස් පුද්. සමාගම, පිටිගල**

වීථි පහන් උපකරණ මිළදී ගැනීමේ බිල්පත පියවීම - රු. 9750.00
(වයර් රෝල්)

**40.රාජ්‍ය විවිධ නීතිගත සංස්ථාව, මාතර**

සෞඛ්‍ය කම්කරුවන් සඳහා උපකරණ ලබා ගැනීමේ බිල්පත - රු. 20640.00

**41.යූ.ජී.රෙස්ටුරන්ට් ඇන්ඩ් බේකරි,උඩුගම**

2019.06.19 දින උඩුගම පවත්වන ලද ඩෙංගු වැඩසටහනෙහි තේ සඳහා වියදම් බිල්පත පියවීම -රු.1040.00

**42. ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,කොළඹ 10**

දුම්රිය බලපත්‍ර බිල්පත් සඳහා මුදල් ගෙවීම -රු.5520.00
තා.සේ.නි.දිළිනි දිසානායක මිය (හික්කඩුව - බදුල්ල)

**<u>43.පොදු අරමුදල් කර්මාන්ත</u>**

සී/ස බද්දේගම ප්‍රාදේශීය සමුපකාර සමිතිය, පුහුල්දූව, බද්දේගම
උඩලමත්ත ගල්කන්ද හේන මාර්ගයට සිලංඩර් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම - රු. 31200.00

**අංක 01 සිට 43 දක්වා ඇති ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**(ඉ) 2.1. 01. ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා**

i. හිටපු දකුණු පළාත් සභා මන්ත්‍රී සිසිර කුමාරරත්න මැතිතුමා විසින් කැප්පිටියාගොඩ මාර්ග සංවර්ධනය සඳහා ලබා දී ඇති රු. 30000.00 ක මුදල නාගොඩවත්ත II අදියර නිවාස සංකීර්ණයේ අතුරු මාර්ගය පිළිසකර කිරීමට යෙදවීම.

**ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**02.** ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා

i. හිටපු දකුණු පළාත් සභා මන්ත්‍රී සිසිර කුමාරරත්න මැතිතුමා විසින් ලබා දුන් මුදලින් රු. 20000.00 ක මුදලක් ගම්මැද්දේගොඩ උතුර කුරුදුකැටිය මාර්ගය පිළිසකර කිරීමට යෙදවීම.

**ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**03.** ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා

i.. දෙල්ගහවත්ත බුදපනාගාම අතුරු මාර්ගය සඳහා කොරිපස් යොදා සංවර්ධනය කිරීම

**ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| | | |
|---|---|---|
| i. | ඌරල මධ්‍යම හක්කිටියාගොඩ මාර්ගයේ ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරීම | -රු.600000.00 |
| ii. | උඩවැලිවිටිය බටහිර බුදුපිළිමය අසළ සිට ගම්මානයේ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | - රු. 600000.00 |
| iii. | වෙදගෙදර මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | - රු. 600000.00 |
| iv. | ගෝණදෙනිය යහලදූවවත්ත මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | - රු. 600000.00 |
| v. | පරණතානායම්ගොඩ රක්ෂණ ගම්මානයේ බෝධිය අසළ සිට මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | - රු. 600000.00 |

**ඉහත සඳහන් මාර්ග සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී කේ.කේ.අයි. නෙරංජලී මහත්මිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

| | | |
|---|---|---|
| vi. | ගොඩැල්ලවත්ත තොටුපල සංවර්ධනය කිරීම | - රු. 60000.00 |
| vii. | 217 ඒ ගම්මැද්දේගොඩ අම්බලන්තොට උතුර තොටුපල සංවර්ධනය | - රු. 150000.00 |
| viii. | නාගොඩ වැලිගොඩවත්ත තොටුපල සංවර්ධනය | - රු. 140000.00 |
| ix. | වැල් පාලම අසළ තොටුපල සංවර්ධනය | - රු. 250000.00 |

**ඉහත සඳහන් තොටුපලවල් සංවර්ධනය සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

x. උක්ඕවිට පෙර පාසල සංවර්ධනය කිරීම - රු. 300000.00

**උක්ඕවිට පෙර පාසල සංවර්ධනය කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**නාගොඩ ප්‍රාදේශීය සභාව**

**(ඉ).4. i. ටෝනර් ලබා ගැනීම සදහා මිල ගණන් කැඳවීම -2019**

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම | ප්‍රිවිව් කම්පියුටර් ටෙක්නොලජී, වදුරඹ | රුචිර කම්පියුටර්, නාගොඩ |
|---|---|---|---|
| HP 35 A ටෝනර් | 9,750.00 | 10,100.00 | 10,400.00 |
| HP 78 A ටෝනර් | 10,500.00 | 10,750.00 | 10,850.00 |
| HP 85 A ටෝනර් | 9,750.00 | 10,250.00 | 10,350.00 |
| Canon 325 ටෝනර් | 14,950.00 | 15,250.00 | 15,650.00 |

**ටෝනර් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් ටෝනර් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් ටෝනර් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඉ).4. ii. වෛරස් ගාර්ඩ් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම -2019**

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම | ප්‍රීවිව් කම්පියුටර් ටෙක්නොලජී, වදුරඹ | රුචිර කම්පියුටර්, නාගොඩ |
|---|---|---|---|
| වෛරස් ගාර්ඩ් | 3,400.00<br><br>ESET internet Security-2019<br><br>01 year warranty | 3,450.00<br><br>ESET internet Security-2019<br><br>01 year warranty | 3,590.00<br>ESET internet Security-2018<br>01 year warranty |

**වෛරස් ගාර්ඩ් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් වෛරස් ගාර්ඩ් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජී, මාපලගම වෙතින් වෛරස් ගාර්ඩ් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මෙනවිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඉ).4. iii. නාම පුවරු මුද්‍රණය කිරීම සඳහා මිල ගණන් කැඳවීම -2019**

| විස්තරය | එක්ස්සලන්ට් ඇඩ්ස්, තල්ගස්වල | ධනුෂ්ක ඇඩ්ස්, යටලමත්ත | දුමින්ද ස්ටිකර්ස්, එප්පල |
|---|---|---|---|
| ඩිජිටල් ප්‍රින්ට් බැනර් වර්ග අඩියක් | 45.00 | සාමාන්‍ය - 45.00 | සාමාන්‍ය - 45.00 |
| | උසස් තත්වයේ - 60.00 | උසස් තත්වයේ - 60.00 | උසස් තත්වයේ - 60.00 |
| ඩිජිටල් ප්‍රින්ට් ස්ටිකර් වර්ග අඩියක් | සාමාන්‍ය - 45.00 | සාමාන්‍ය - 45.00 | සාමාන්‍ය - 45.00 |
| | උසස් තත්වයේ - 60.00 | උසස් තත්වයේ - 60.00 | උසස් තත්වයේ - 60.00 |
| | 14,950.00 | 15,250.00 | 15,650.00 |

**නාම පුවරු මුද්‍රණය කිරීම සඳහා සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල එක්ස්සලන්ට් ඇඩ්ස්, තල්ගස්වල වෙතින් නාම පුවරු මුද්‍රණය කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල එක්ස්සලන්ට් ඇඩ්ස්, තල්ගස්වල වෙතින් නාම පුවරු මුද්‍රණය කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

## (ඉ).4. iv. UPS ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම -2019

| විස්තරය | ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම | ප්‍රීවිව් කම්පියුටර් ටෙක්නොලජි, වදුරඹ | රුවිර කම්පියුටර්, නාගොඩ |
|---|---|---|---|
| UPS - 650VA | 4,900.00<br>Battery - 01 year Warranty<br>System - 02 year Warrenty | 5,100.00<br>Battery - 01 year Warranty<br>System - 02 year Warrenty | 5,150.00<br>Battery - 01 year Warranty<br>System - 02 year Warrenty |

**UPS මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම වෙතින් UPS මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලජි, මාපලගම වෙතින් UPS මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

## (ඉ).4.v. ප්ලාස්ටික් හෝස් එකක් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම -2019

| විස්තරය | ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටවගම | දයානි හාඩ්වෙයාර්, මාපලගම | නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ |
|---|---|---|---|
| ප්ලාස්ටික් හෝස් එකක් | රු. 845.00 | රු. 850.00 | රු. 990.00 |

ප්ලාස්ටික් හෝස් එකක් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටවගම වෙතින් ප්ලාස්ටික් හෝස් එකක් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටවගම වෙතින් ප්ලාස්ටික් හෝස් එකක් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී එන්.ඩබ්. පතිනායක මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

### (ඉ).4.vi.ලදුපත් පොත් මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීම -2019

| විස්තරය | අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල | කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල | චන්දිම ග්‍රැෆික්ස්, ඇල්පිටිය |
|---|---|---|---|
| ලදුපත් පොත් මුද්‍රණය | රු. 172.50 | රු. 390.00 | රු. 290.00 |

ලදුපත් පොත් මුද්‍රණය සඳහා සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල වෙතින් ලදුපත් පොත් මුද්‍රණය කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල වෙතින් ලදුපත් පොත් මුද්‍රණය කිරීම සුදුසු බව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

### (ඉ).4.vii.සාහිත්‍ය තරඟාවලිය සඳහා සහතිකපත් මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීම -2019

| විස්තරය | අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල | කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල | විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල |
|---|---|---|---|
| සහතිකපත් මුද්‍රණය සඳහා | රු. 34.40 | රු. 59.00 | රු. 24.00 |

**සාහිත්‍ය තරඟාවලිය සඳහා සහතිකපත් මුද්‍රණය කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල වෙතින් සාහිත්‍ය තරඟාවලිය සඳහා සහතිකපත් මුද්‍රණය කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල වෙතින් සාහිත්‍ය තරඟාවලිය සඳහා සහතිකපත් මුද්‍රණය කිරීම සුදුසු බව ගරු නෙලී වක්වැල්ල මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී අරුණ ශාන්ති මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

### (ඉ).4.viii. ආකෘති පත්‍ර මුද්‍රණය සඳහා මිල ගණන් කැඳවීම -2019

| විස්තරය | අතුකෝරල ප්‍රින්ටර්ස්, පිටිගල | කෙත්සිරි කමියුනිකේෂන්, තල්ගස්වල | විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල |
|---|---|---|---|
| ආකෘතිපත්‍ර මුද්‍රණය<br>A4 - one side<br>A4 - Double side | රු. 2.95<br>රු. 3.45 | රු. 2.50<br>රු. 3.75 | රු. 2.50<br>රු. 2.50 |

**ආකෘති පත්‍ර මුද්‍රණය සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල වෙතින් ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල විමාෂ ප්‍රින්ටර්ස්, පිටිගල වෙතින් ආකෘති පත්‍ර මුද්‍රණය කිරීම සුදුසු බව ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රීනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඉ).4. ix. කොම්පෝස්ට් පැකට් කිරීමට අවශ්‍ය ප්‍රින්ටඩ් පොලිතීන් බෑග් ලබා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම -2019**

| විස්තරය | DNP eco Polythene Company,wattahena, Elpitiya | Globle Polymers (Pvt)ltd, panadura | Green pack lanka company, Hikkaduwa |
|---|---|---|---|
| පොලිතීන් බෑග් සඳහා<br><br>14*18<br><br>12*16 | <br><br><br><br>9.90<br><br>7.40 | <br><br><br><br>10.20<br><br>7.65 | <br><br><br><br>10.65<br><br>8.10 |
| | Block charges - 8000.00 Minimum Quntity - 5000 bags | Block charges 8500.00 Minimum Quntity - 5000 bags | Block charges 8500.00 Minimum Quntity - 5000 bags |

කොම්පෝස්ට් පැකට් කිරීමට අවශ්‍ය ප්‍රින්ටඩ් පොලිතීන් බෑග් මිළදී ගැනීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල **DNP eco Polythene Company,wattahena, Elpitiya** වෙතින් කොම්පෝස්ට් පැකට් කිරීමට අවශ්‍ය ප්‍රින්ටඩ් පොලිතීන් බෑග් මිළදී ගැනීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල **DNP eco Polythene Company,wattahena, Elpitiya** වෙතින් කොම්පෝස්ට් පැකට් කිරීමට අවශ්‍ය ප්‍රින්ටඩ් පොලිතීන් බෑග් මිළදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.

**(ඉ).4. x. කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා මිල ගණන් කැඳවීම -2019**

| විස්තරය | Grand Motors, Wanduramba | Chamara Motors, Mapalagama | samantha Motors , Baddegama |
|---|---|---|---|
| බ්රේක් පෑඩ් | 9,000.00 | 15,000.00 | 11,500.00 |
| බ්රේක් ඔයිල් | 850.00 | 850.00 | 850.00 |
| බ්රේක් පෑඩ් මාරු කිරීම සඳහා | 2,000.00 | 2,750.00 | 2,500.00 |
| එකතුව | **11,850.00** | **18,600.00** | **14,850.00** |

**කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා ලැබී තිබූ මිළ ගණන් අනුව අඩුම මිළ ගණන් ඉදිරිපත් කල Grand Motors, Wanduramba වෙතින් කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු කිරීමට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කරන ලදී. අඩුම මිළ ගණන් ඉදිරිපත් කල Grand Motors, Wanduramba වෙතින් කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු කිරීම සුදුසු බව ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා**

- ❖ 2019.08.08 දින නාගොඩ ප්‍රාදේශීය සභාවේ පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී.

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- ❖ 2019 ජූලි මාසයට අදාල මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශය සළකා බැලීම සඳහා අගෝස්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2019 ජූලි මාසයට අදාල මාසික ඒකාබද්ධ වැය සාරාංශය සළකා බැලීම සඳහා අගෝස්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- ❖ 2019 ජූලි මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් සළකා බැලීම සඳහා අගෝස්තු මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

- ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා අසනීප තත්වයෙන් පසුවන බැවින් අද දින සභාවට සහභාගී නොවන බව දන්වා ඇත. එබැවින් ඔහුට නිවාඩු ලබා දෙන ලෙස ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා යෝජනා කල අතර, ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා එම යෝජනාව ස්ථිර කරන ලදී.

**(ඌ) .වෙනත් කරුණු :-**

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි වෙනත් කරුණු ඉදිරිපත් කිරීමට මත්තෙන්, මම පස්වෙනි මාසයේ යෝජනා කීපයක් ඉදිරිපත් කළා. ඒ අතරින් උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යාකරන මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර දෙන්න කියන ඉල්ලීමත්, ඒ වගේම ගල්ලෙනමුල්ල මාර්ගයේ සංවර්ධන කටයුතු සඳහා කම්කරුවන් හෝ යොදවා අවශ්‍ය කටයුතු කරලා දෙන්න කියලා යෝජනා දෙකක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම හෙට දවසේ අපි ශ්‍රමදාන මට්ටමින් ඒ ගල්ලෙනමුල්ල මාර්ගයේ ඒ කටයුත්ත සිදුකිරීමට බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා යම් සහයෝගයක් අපට ලබා දෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඊට වඩා උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ යාකරන මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරගන්න එක ගැන අපි යෝජනා ස්ථිර කරලා තියෙන්නේ. ඒ කටයුතුවල ප්‍රගතිය පිළිබඳව තමයි මට දැනගන්න ඕන. මොකද මේ ඉතාම බැරෑරුම් මාර්ගයක්. ඒ මාර්ගයේ පවරා ගැනීමේ කටයුතු සඳහා මොකක්ද කරලා තියෙන්නේ කියලා තමයි මට දැනගන්න ඕන.

**ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්,** පාරවල් පවරාගැනීම ක්ෂණිකව කරගත නොහැකි බවත්, එහි යම්කිසි ක්‍රමවේදයක් ඇති බවත් ප්‍රකාශ කළ අතර, තමන්ගේ බල ප්‍රදේශයේ තියෙන පාරවල් නම් කරලා එවන්න කියලා කියා ඇති බවත්, ඒ පාරවල් සියල්ල එකතුකරගෙන මැනුම් කටයුතු කරලා, ගැසට් කරලා, ඒ කටයුතු සිදුකළ යුතු බවත් පවසන ලදී. ඒ වගේම ඒ සඳහා ඔබතුමන්ලාත් උනන්දු වී කටයුතු කරන මෙන් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා**

ගරු සභාපතිතුමනි මට ප්‍රශ්න දෙකක් ගැන අහන්න තියෙනවා. ගරු සභාපතිතුමනි මේ සභාව තුළදී, අපි යෝජනා ස්ථිර කරලා අපි ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන දේවල් මේ සභාවේ සිටින අනෙක් පුද්ගලයන්, විශේෂයෙන්ම මේ සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා රජයෙන් පඩි ගෙවා පත්කරන නිලධාරීන්, කාර්ය මණ්ඩලය මේ සඳහා උනන්දු වෙන්න ඕන. මේ සභා වාර්තාවක් කළාට පස්සෙ, ඊළඟ සභා වාර්තාව එනකම් මේ කිසි දෙයක් පිළිබඳ අවධානයක් යොමු කර නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමා ඇතුළු මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු මෙතන රැස් වෙලා බොරු වැඩක් කරන්නෙ. විශේෂයෙන්ම මම ඒ ගැන කනගාටුවෙනවා. පළමුවෙන්ම මේ සභාවෙ ඡන්දෙන් පත්වෙච්ච මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවා. ඊට අමතරව පක්ෂයේ විශ්වාසය පළ කරලා තමන්ගේ කාර්යභාරය හරියට ඉෂ්ඨ කරාය කියන පරමාර්ථයෙන් යම් පිරිසක් මෙතන ජාතික ලැයිස්තුවෙන් පත්කරලා එවලා තියෙනවා. ඇත්තටම මේ මන්ත්‍රීවරු තමන්ගේ කාර්යභාරය පිළිබඳව සලකනකොට ඒ ගැන මට කණගාටු හිතෙනවා. අපට මේ දීපු කාලසීමාව තමයි මේ දවසින් දවස ගත වෙන්නේ. ගෙවීම් වාර්තාව ගත් විට ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදවපු කාර්යයන් මොකක්ද කියන එක පිළිබඳව අපට පේනවා. ඒ ගැන කණගාටුයි. අපි කියන්නේ මේ අමතර ගෙවීම් සියල්ලම කරන්න ඕන. නමුත් සභාව නැති දවසක මේ සභාවට ඇවිල්ල බලන්න සභාවෙ තත්වය කොහොමද කියන එක. සමහර වෙලාවට ලී බඩු ප්‍රදර්ශනාගාරයක් වගේ. ඒ නිසා මාත් එක්ක කවුරු තරහා වුනත් මම මේ ටික කතා කරන්න හිටියේ. ඒ නිසා මට මේකට ආපු වෙලාවේ ඉඳලා පුදුම වේදනාවක් සහ කණගාටුවක් ඇතිවෙනවා. මේ සභාව මීට වඩා විධිමත් වෙන්න ඕන. අපට භාර දීපු කාලය දවසෙන් දවස, පැයෙන් පැය තමයි මේ ගතවෙන්නෙ. ඒ නිසා අපි ඒ ගැන කනගාටුවට පත් වෙනවා. ඒ වගේම සභාවට මන්ත්‍රීවරයෙක් ආවම,

ඒ මන්ත්‍රීවරයෙක්ද, කවුද කින්ද මන්ද කියලා සැලකිල්ලක් ඇත්තෙ නැහැ. ඒ වගේම ඉදිරිපත් කළ යෝජනාවක් සම්බන්ධයෙන් කවදාවත් නිවැරදි විදිහට ලියුමක් ගියේ නැහැ. විශේෂයෙන්ම මම එල් 15888 නඩුව සම්බන්ධයෙන් ලිපියක් සකස් කරන්න කිව්වම, ලිපිය හැදුවේ නොගෙවන තත්ත්වයට පත්කරලා. පළාත් පාලන පනතේ පැහැදිලිව සඳහන් වෙනවා මේ සඳහා මැදිහත් වීමක් කරන්න පුළුවන් කියලා. එනිසාම මෙතනදී ගරු සභාපතිතුමනි, කොහොම වුණත් කමක් නැහැ. මම විවේචනය කරනවා නෙවෙයි. මම පළාත් පාලන දෙපාර්තමේන්තුවට පසුගිය දවස්වල කිහිප අවස්ථාවකදිම ගියා. ඒ අයත් බලන්නේ මේ මහජන නියෝජිතයෙක් ද, මොකක්ද කියන එක නෙවෙයි. පුළුවන් තරම් හිර කරලම දාන්න තමයි උත්සාහ කරන්නෙ. මොන විදිහකින් හරි වෙන දෙයක් වෙයි. මම දැන් ඒක අතහැරලා ම තියෙන්නේ. කොහොම වුණත් ලබන 27 වැනිදා නැවත නඩුව කැඳවනවා. අපේ ඉනෝකා මන්ත්‍රීතුමියලයි ගෙදර ළඟම තියෙන්නේ. ඒ නිසා ඔබතුමියත් පොඩ්ඩක් ඒ ගැන උනන්දු වෙන්න. ඒවගේම අපි මන්ත්‍රීවරු වශයෙන් ගමට ගිහිල්ලා ගමේ මිනිස්සුන්ට මොනවද කරන්නේ? අපි හැමදෙනාටම ඒ ගැන වගකීමක් සහ යුතුකමක් තියෙනවා. ඒ නිසා අපි සභාවක් නඩත්තු කරනවා වගේම, සභාවෙන් යම් කාර්යයක් ගමටත් වෙන්න ඕන. ඒ  සඳහා මේ මන්ත්‍රීවරු සියලුදෙනාම සහ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම වගකියන්න ඕන. අපි සියලු දෙනාම හෘද සාක්ෂියට එකඟව වැඩකටයුතු කරන්න ඕන. අපට දීලා තියෙන්නේ අවුරුදු හතරක වගේ කෙටි කාලයක්. මේ කෙටි කාලය තුළදී මහජනයා වෙනුවෙන් යම් සේවාවක් කරන්න බැරි වුනොත් අපි අප්‍රසාදයට පත් වෙනවා. මාසෙකට වරක් සභාව රැස් වෙලා විවිධ වූ ගෙවීම් අනුමත කරල දීලා, ඒ කාර්යයන් අනුමත කරලා දුන්නත් කමක් නැහැ. අදාල රාජකාරි කටයුත්ත, ඒ කියන්නේ මේ වාර්තාවෙන් පැන නගින ගැටලු ටික ඊලග සභාවාරය වෙනකොට විසඳීමේ වැඩපිළිවෙළක් සූදානම් කරන්න ඕන. අඩුම තරමින් මෙන්න මේ සම්බන්ධයෙන් මේ වගේ වැඩ පිළිවෙළක් තියෙනවා, මෙන්න මේ යෝජනාව ඇවිල්ල තියෙනවා, ඒ ආදිය කියලා මන්ත්‍රීවරුන්ට ලියුමක් හරි යවන්න. තව දෙයක් කියන්න ඕන. සභාව හැටියට සභාව පිටුපස ප්‍රදේශයට ගියහම, ට්‍රේලරයක් උඩ විශාල කුණු ගොඩක් තියෙනවා. දවසක් අපේ සභාපතිතුමා එම ස්ථානයේ වාඩි වෙලා ඉන්න වෙලාවේ සභාපතිතුමාගේ ඇඟට සත්තු ගොඩක් වැටුනා. ඉතිං ඒ නිසා ඒ සඳහා අපි යම් වැඩපිළිවෙළක් සකස් කරන්න ඕන. මම මේ කරන්නේ ස්වයංවිවේචනයක්. ස්වයංවිවේචනයක් නොකර මේක සාර්ථක කරගන්න බැහැ. එනිසා මම කාටවත් දොස් කියනවා නෙවෙයි. අපේ ඇඟිලි මැෂින් එකක් සවි කළා කියලා කාර්යයන් එහෙම සිද්ධ වෙන්නේ නැහැ. මේ කාර්යය සඳහා අපේ ගරු සභාපතිතුමාට ලේකම්තුමියගේ නිබඳ සහාය අත්‍යවශ්‍යයි. මන්ත්‍රීවරු ටික ඇවිල්ලා මේ සභා රැස්වීමට සහභාගි වෙලා, නැවත ඊළඟ සභා රැස්වීමට සහභාගී වෙනවා නම් මේ කාර්යය සාර්ථක වෙන්නේ නැහැ. ඒ නිසා තමයි මම කිව්වේ මන්ත්‍රීවරුන් හැටියට අපෙත් වගකීමක් තියෙනවා. ඒ වගේම ඒ වගකීම මෙතන සේවය කරන පහලම සේවකයාගේ ඉඳලා ඉහළම සේවකයා දක්වා මේ කාර්යය කරන්න මේ හැමදෙනාගෙන්ම සහය ලැබෙන්න ඕන. ඒ වගේම සියලු දෙනාගේ අදහස් හා යෝජනා අවශ්‍ය වෙනවා. මට සමහර වෙලාවට විපක්ෂ මන්ත්‍රීවරු සමග කේන්ති එනවා. මොකද මේ හැම දෙයක් පිළිබඳව ම මීට වැඩිය තර්ක-විතර්ක කරලා මෙය පිළිබඳ හොයල බලන්න ඕන. අපි ඒ දේවල් කිරීම් වෙනුවෙන් අපට සොච්චම් මුදලක් හරි ලැබෙනවා. මම මේ නිරන්තරයෙන් මේ කරුණු ගැන ඉදිරිපත් කරන්නේ මේක නිවැරැදි මාවතට ගෙන එන්න ඕන නිසා. ගරු සභාපතිතුමා, ලේකම්තුමිය නැති අවස්ථාවක සභාවට ඇවිල්ල බලන්න. මේවයි සිදුවන කාර්යයන්. හෙට මට කවුරු උදව් නොකරත් මම මේ දිහා මාස 3ක් තිස්සේ බැලුවා. ඒ නිසා එම කරුණු කිව යුතුමයි කියලා විශ්වාස කළා. මට තව ගොඩක් දේවල් කියන්න තියෙනවා. ඒවත් අමතකයි. ඒ තරම් කලකිරීමට පත් වෙලා තියෙන්නෙ. අපි සියලු දෙනා අපේ හෘද සාක්ෂියට අනුව වැඩ කටයුතු කරමු.

ඒ වගේම ගරු සභාපතිතුමා ගෙන් මම ඉල්ලීමක් කරනවා. පුළුවන්නම් විතරක් හෙට ගල්ලෙනමුල්ල මාර්ගය ශ්‍රමදාන මට්ටමින් අවශ්‍ය කටයුතු කරනවා. ඒ සඳහා සහභාගි වෙන්න කියලා ආරාධනා

කරනවා. ඒ වගේම කොරි පස් ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා මම අවට ෆැක්ටරි සමඟ සාකච්ඡා කළා. මොන වගේ ප්‍රතිඵලයක් ලැබෙයිද දන්නෙ නැහැ. කොහොම නමුත් ගල්ලෙනමුල්ල මාර්ගය ගමන් කිරීමට ඉතාම අපහසු තත්වයට පත් වෙලා තියෙනවා. එනිසා හෙට දවසෙ කොච්චර වැස්සත්, කොහොම හරි පස් ටිකක් දාගන්න කටයුතු කරනවා. ඒ නිසා සභාවට පුළුවන් කමක් තියෙනවා නම්, ඒ සඳහා අපට කොරි පස් ප්‍රමාණයක් ලබාදෙන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

අපේ නිශාන්ත නන්දන මන්ත්‍රීතුමා කිව්ව වගේම, අපටත් මේ ස්ථානයේ හිට ගැනීමේ අවස්ථාව යම් පක්ෂයක්, යම් කණ්ඩායමක් විසින් තමයි නිර්මාණය කරලා මේ ස්ථානයට අපි එව්වේ. ඉතින් ඒ නිසා මේ වෙලාවෙදි අපි අද මෙතන ආණ්ඩු පක්ෂය හැටියට කටයුතු කළත්, ආණ්ඩුවක් හැටියට ගත්තම අපි අද විපක්ෂයේ තමයි මේ අවස්ථාවන්වලදී කටයුතු කරන්නේ. ඉතින් ඒ නිසා මම ගරු සභාපතිතුමාගෙන් තවත් ඉල්ලීමක් කරනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් නාමලේඛනයක් ඇවිල්ලා තියෙනවා. අපේ මන්ත්‍රීතුමාලට ලැබුණු ප්‍රතිපාදන හැටියට, ගම්පෙරළිය වගේ වැඩසටහන්වලින්, ගල්ලෙනමුල්ල මාර්ගය ගැන තමයි මම සඳහන් කළේ. සුගතදාස මහත්මයාගේ නිවසට හැරෙන තැන ඉඳලා ඉන් එහාට යන්නෙත් අර මඩ වලින් බැහැලා. ඒ නිසා පුළුවන්නම් සාකච්ඡා කරලා, කහවෙ ගෙදර ළඟ ඉඳලා ඔය මඩ වල තියෙන තැන ඉඳලා ඉස්සරහට ඔය කොන්ක්‍රීට් එක දැම්මොත් ඉතාම ඵලදායි තත්ත්වයක් ඇතිවෙනවා. කාටත් ප්‍රයෝජනයක් වෙන විදිහේ වැඩක් වෙන්නෙ. මොකද සම්පත් ප්‍රජා ශාලාව හරියෙ යන්න බැරි තත්ත්වයකට පත් වෙලා තියෙනවා. ඉතින් ඒ නිසා හැකියාවක් තියෙනවනම්, ඔබතුමා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා, ඒ ගමේ සුබසිද්ධිය සඳහා තමයි ඒ අවකාශ ලබා දීලා තියෙන්නෙ. ඒ නිසා අපේ සභාවට අනුමැතියට ආවට පස්සෙ පුලුවන්නම් ඒකට යෝජනාවක් හැටියට, එකතු කරලා පිටත් කරන්න මෙන්න මේ කටයුත්ත සිද්ධ කරලා දුන්නොත් හොඳයි කියලා.

ඊළඟට මේ ප්‍රාදේශීය සභා පිහිටුවන්නත් අවුරුදු එකහමාරකට විතර කලින් ඉදිරියේ පැවැත්වෙන ජනාධිපතිවරණය සඳහා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා හැටියට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් අපි ඉදිරි ජනාධිපතිවරණයට ඉදිරිපත් කරන්න සූදානම් කරලා තියෙනවා. ඒ වගේම ඒකෙදි අපි පැහැදිලිවම සඳහන් කරනවා කිසිම පක්ෂයක්, කිසිම දේශපාලන කණ්ඩායමක් මේ වනවිට මැතිවරණයක් සඳහා කිසිම සූදානමක් පෙරනිමිත්තක් නැති අවස්ථාවක, අපි අවුරුදු එකහමාරකට කලින් පළාත් පාලන මැතිවරණය ජයග්‍රහණය කළාට පස්සේ, ගම්මට්ටමින් සමීක්ෂණයක් කරලා අවශ්‍ය සාමාජිකයින් බඳවා ගැනීම සඳහා යම් වැඩපිළිවෙළක් සූදානම් කළා. ඒ වැඩ පිළිවෙල සූදානම් කරලා එතනින් සාමාජිකයෝ බඳවාගෙන, ගමේ ශාඛා සමිති සංවිධානය කරලා, බලමණ්ඩල සූදානම් කරලා, කාන්තා සංවිධාන සූදානම් කරලා, තරුණ බල මණ්ඩල සූදානම් කරලා, ඒ සියලු දේවල් සූදානම් කරලා, ආසියාවේ හොඳම පක්ෂයක් හැටියට අපි දැන් මෙතන ඉන්නවා. මගේ කතාවෙන් පස්සේ ගොඩක් තර්ක විතර්ක මෙතන නිර්මාණය වේවි. මම මේක කියන්න හේතුව වුණේ අද උදේ ප්‍රවෘත්ති බැලුවත් දකින්න ලැබුණේ මේ ගෝඨාභය රාජපක්ෂ කියන චරිතය නිකං උඩින් පහත් වුනා වගේ තමයි සාකච්ඡා වෙන්නේ. ඉතින් ඒ නිසා අපි ඒ වගේ වකවානුවක් තුළදී ඒ වගේ විශාල කාර්යභාරයක් කරමින්, අපේ ඉදිරි ජනාධිපතිවරණයේ අපේ අපේක්ෂකයගේ ප්‍රතිපත්ති මාලාව සකස් කරන්න ගම්මට්ටමින් ගම සමඟ පිළිසඳරක් වැඩසටහන නිර්මාණය කරලා, ඒ සඳහා යෝජනා අරගෙන, යම් ප්‍රතිපත්ති ප්‍රකාශනයක් හදලා, අපි ඉදිරියේ යම් වැඩපිළිවෙළක් සූදානම් කරන්න අපි සූදානම් කරලා තියෙනවා. ඉතින් ඒ නිසා කවුරු මොනවා කිව්වත්, මොන විදිහට මොන අපේක්ෂක ඉදිරිපත් කළත්, නියත වශයෙන්ම 2020 මේ රටේ විධායක ජනාධිපතිවරයා හැටියට ගෝඨාභය රාජපක්ෂ මහතා පත්කරන්න සියලු කටයුතු සූදානම් කරනවා කියන එකත් සිහිපත් කරමින්, මට අවස්ථාව ලබාදීම ගැන ස්තූතිවන්ත වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපි අපේ සභාවාරය පවත්වන ශාලාව වායුසමීකරණය කරලා, ඉතා පිරිසිදුව තියාගෙන ඉන්නවා. මම විශේෂ යෝජනාවක් ගේනවා. අපේ ජනරජ ලාංඡනයේ පොඩි වෙනසක් කෙරුවොත් හොඳයි කියලා. බලන්න ඒකෙ තියන අපැහැදිලිතාවය, අපිරිසිදුභාවය. වැඩි මුදලක් යන එකක් නැහැ. අලුතින් එකක් සවි කරනවා නම් හොඳයි. දැනට තියෙන ලාංඡනය අපේ ශාලාවට ඔබින්නේ නැහැ. ඒ නිසා ඊළඟ සභාවාරය වෙනකොටවත් ඒක පිරිසිදුවට ලස්සනට හදා තියන්න කියලා යෝජනා කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා**

ගරු සභාපතිතුමන් ඇතුළු සභාවෙන් අවසරයි. අපේ ගරු සභාපතිතුමාට ප්‍රථමයෙන්ම මගේ ස්තූතිය පුද කරනවා. මොකද කුඹුරුහේන වැව් ඉස්මත්තේ පැල 750ක් රෝපනය කලා. ඒ සඳහා අපට වතුර බවුසරයක් ලබා දීම ගැන මුළු සභාව වෙනුවෙන්ම මම මගේ ස්තූතිය පුද කරනවා. ඒ වගේම අපට පැල හම්බවුනේ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා ග්ලෝබල් සමාගමෙන් කුඹුක්, කොස් ආදී වටින පළතුරු වර්ග, බෙහෙත් ඖෂධ වර්ග තමයි අපි හිටෙව්වේ. ඒ වගේම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාගේ කතාවට මමත් එකඟ වෙනවා. මොකද අපි මෙතනට ආවේ උපතේ සිට මරණය දක්වා කියන අදහසින් යෝජනා අරගෙන ඇවිල්ලා ඉදිරිපත් කරන්න. නමුත් ඇත්තටම කණගාටුයි. මීට පෙරත් මම යෝජනා වගයක් ගෙනාවා. ඒවා න්‍යාය පත්‍රයට ඇතුළත් වුණේ නැහැ. මේ සැරෙත් මම යෝජනා තුනක් හා ප්‍රශ්න තුනක් යොමු කරලා තිබුණා. මම දන්නෑ මොන හේතුවක් නිසාද කියලා. ඒවත් නැහැ. මේවා මගේ යෝජනා නෙවෙයි. මිනිස්සු ඉල්ලන දේවල් තමයි  මම යෝජනා විදියට ඉදිරිපත් කළේ.

1. ඒ වගේම අප බල ප්‍රදේශයේ ඇති ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා සම්බන්ධීකරණ කමිටුව නැවැත රැස් කිරීම සඳහා නිසි බලධාරීන් දැනුවත් කරන්න

ඒ කියන්නේ මෙතෙක් කල් සම්බන්ධීකරණ කමිටුව රැස්වුනේ දෙපාර ද කොහෙද. අපට මෙතනදී කරන්න බැරි දේවල් එතැනදී කතා කරලා විසඳගන්න පුළුවන්. නමුත් එම ප්‍රශ්නවලට විසඳුමක් නැහැ. ඒ කියන්නේ ඒ සම සභාපතිවරුන්ට ලක්ෂ දෙකක් දීලා තියෙනවා, වාහනයක් දීලා තියෙනවා. නමුත් ඒ කටයුතු කෙරෙන්නේ නැහැ.

අනිත් කාරණාව තමයි ජනමාධ්‍යවේදීන්ව සභා රැස්වීමට කැඳවීමට ආරාධනා කරන්න කිව්වා. සභාවට ඇවිල්ලා මේ තොරතුරු ටික පත්තරේකට හරි පළවෙන්න අවශ්‍ය නිසා. නමුත් ඒකත් නැහැ. මම ඒ අවස්ථාවේදී යෝජනාවක් වශයෙන් ගෙන ආවේ මාධ්‍යවේදී මහත්වරුන්ට කිසියම් මුදලක් දීලා හරි මේ අවස්ථාවට කැඳවන්න කියලා. ඒ යෝජනාව ආවෙත් නැහැ.

අනිත් යෝජනාව තමයි අපේ රට කෘෂිකාර්මික රටක් වුවත්, ගව ප්‍රශ්නය නිසා කෘෂිකර්ම කටයුතු කරගෙන යන්න බැරි වෙලා තියෙන්නේ. ඒවට කිසිම පිළිතුරක් දෙන්න ඒ යෝජනාව ගත්තෙත් නැහැ.

අනිත් එක මම එදා ඉඳලම කතා කරනවා. අපේ පාරේ බස් වැඩ කරන්නෙත් නැහැ. බයිසිකලයකින් වත් යන්න බැහැ. ටියුෂන් ක්ලාස් වලට ගිහිල්ලා ළමයි ගෙවල් වල යන්න ගොඩක් රෑ වෙලා. ඉතිං මම වීථි ලාම්පු තුනක් හතරක් ඉල්ලුවා. දැන් අවුරුදු දෙකකට ආසන්න වෙනවා. ලාම්පු තුනයි ලැබිලා තියෙන්නේ. ඊට පස්සේ මම කිව්වේ ඒ වීදි ලාම්පු අපි දැම්මට අපට නඩත්තු ගාස්තුවක් විදුලිබල මණ්ඩලයෙන් ගෙවනවා. ඒ ගාස්තුව ලැබෙනවද? ඒ මුදල කීයද?යන  ප්‍රශ්නය.

ඊට පස්සේ ඇහුවේ මේ සභාව සතු ධාවනය වන වාහන කීයක් තියෙනවද? ධාවනය නොවන වාහන කීයක් තියෙනවද? අන්න ඒ ප්‍රශ්න තුන තමයි මම අහල තිබුනේ. නමුත් ඒක න්‍යාය පත්‍රයට ආවෙ

නැහැ. හැබැයි වෙන කවුරුහරි උදේ වුනත් යෝජනාවක් ගෙනාවොත්, රීති යටතේ හරි දාල සභාවෙ කියවනවා.

අනික, එක් එක් කමිටු තියෙනවා. නමුත් එක් කමිටුවක්වත් රැස් කරන්නේ නැහැ. පරිසර කමිටු, පුස්තකාල කමිටු ආදිය රැස් කරන්නේ නැහැ. ගාල්ලට ගියහම කවුද කමිටුවලට ඉන්නේ කියලා අහනවා. මොනවද ඒකෙන් කරලා තියෙන්නේ කියලා අපෙන් අහනවා. පරිසරය ගැන අහන්නෙ නැහැ. පුස්තකාලය ගැන හොයන්නේ නැහැ. ඒක තමයි අපෙන් අහන්නේ. මේ සභාව මොකද්ද කරන්නෙ කියලා. දැන් වෙනත් සභාවල යෝජනා ඇවිල්ලා කමිටු රැස්කරගෙන වැඩපිළිවෙළක් යනවා. අපට දෙන්න උත්තරයක් නැහැ.

ඒ වගේම තමයි ඉස්සෙල්ලා යෝජනාවක් ගෙනාවා. අපේ නන්දන මන්ත්‍රීතුමාත් දන්නවා. කුඹුස්ස පාලමේ පැති බැම්ම ගැලවිලා තියෙනවා. එතනින් ළමයි 150ක් 200ක් විතර බස් එකේ ගමනාන්තය දක්වා එනවා. පාලමෙන් ඒ බස්රථය ගන්නේ බොහොම අමාරුවෙන්. සමහර වෙලාවට ළමයි ටික බස්සවලා තමයි බස්රථය ගන්නේ. එතැනට යකඩ තහඩුවක් ඉල්ලුවා. ඒ කිසිම දෙයක් දෙන්න බැරි හේතුවවත් අපට දන්වා එවන්නේ නැහැ. ඇත්තටම මේක අපේ සභාවේ වගකීමක්. මේ කාලය තුළ බස්රථ අනතුරු සිදු වෙනවා. ඒ වගේ කාලයක් තුළ අපට පාලමට තහඩුවක් හරි දාලා ප්‍රශ්නය නිරාකරණය කරලා දෙන්න කියලා මම ඉල්ලනවා. මේ දේවල් කරන්නේ අපේ දරුවෝ වෙනුවෙන්.

ඒ වගේම තමයි අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ ජනාධිපති අපේක්ෂකයන් සියලුම දෙනා දැන් තෝරාගෙන යනවා. ඒ වුණත් මේ නව ලිබරල් ක්‍රමය යටතේ තනිකරම ආර්ථිකය පුස්සක් බවට පත් වෙලා තියෙනවා. කොයි කවුරු කිව්වත් මේ නව ලිබරල් ක්‍රමය යටතේ සියලුම සම්පත් ටික විකුණගෙන කටයුතු කරනවා. මේ සැරින් සැරේ ජොබ් දුන්නෙත් උතුරු පර්යන්තය විකුණලයි කියලා අපි බය නැතුව කියනවා. එහෙම නැත්නම් ඔය ජොබ් දෙන්න භාණ්ඩාගාරෙ මුදල් නැහැ. ඒ වගේම තමයි 18 වෙනිදා, ඉස්සර රැළි පැවැත්තුවේ ක්‍රම ක්‍රමයෙන්. ඒ කියන්නේ BRC එකෙන් පටන් ගත්තා. ඊට පස්සේ ඔබතුමාලා ඊයේ පෙරේදා සුගතදාසෙ කිව්වා. ඊළඟට අපි යන්නේ ගෝල්ෆේස් එකට. අපි තනියෙන් තමයි අපේ ගමන යන්නේ. සියලුම කලාකාරයන්, විද්වතුන්, සියලුම විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන් රැස් කරලා අනිවාර්යයෙන්ම ගෝල්ෆේස් එක පුරවනවා. අපි අපි අපේ බලවේගය පෙන්නනවා. ඒ නිසා දැනටත් අවස්ථාව තියෙනවා. සියලු දෙනාටම එකතු වෙලා අපි රට වෙනුවෙන් හොඳ ගමනක් යන්න ආරාධනා කරමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රිනි අරුණ ශාන්ති මහත්මිය**

ගරු සභාපතිතුමාගෙන්ද, සභික මහත්ම මහත්මීන්ගෙන් ද අවසරයි. මම පළමුවෙන්ම සභාපතිතුමාට ස්තූතියක් කරනවා. මගේ ගෙවතු වගා වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වයක් ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කිරීම පිළිබඳව. ඒ වගේම ප්‍රදේශයේ වීථි පහන් කිහිපයක්ම අක්‍රීය වී තිබුණා. විසන්ධි වී තිබුණා. එයිනුත් එකක්, දෙකක් වගේ ලාම්පු අපට ලැබුණා. තව වීථි ලාම්පු හතරක් විතර තියෙනවා. ඒවත් අත්‍යාවශ්‍යම වීථි ලාම්පු හතරක්. ඉතින් මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ වීථි ලාම්පු හතරත් ලබාදෙන්න කියලා.

ඒ වගේම තමයි ගරු සභාපතිතුමනි, මම ගිය සභාවාරයට කලින් සභා වාරයේදී අපේ කුරුපනාව පෙර පාසල අසල සුගත් මහත්මාගේ නිවස අසල ගල්වැටිය පාරට ඇවිල්ලා තියෙනවා කියලා සභාවේදීම සභාපතිතුමාට දැනුම් දුන්නා. එතන අනතුරුදායකයි දැනට අනතුරු හතරක් සිදුවෙලා තියෙනවා. ඊයේ තවත් අනතුරක් සිදුවෙලා තියෙනවා. ඉතිං ඒ ගල් ටික අයින් කරගන්න එතුමාට දන්වනවනම් හොඳයි. එතන පෙරපාසලක් පැවැත්වෙන නිසා ගොඩක් වාහන ගමන් කරනවා. ඒ වගේම වංගු සහිත ස්ථානයක් බැවින් ඒ ගැන අවධානය යොමු කරන්න කියල ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ

ගෝනදෙනිය පෙරපාසල, සෞඛ්‍ය මධ්‍යස්ථානය අසල පස් කණ්ඩිය කඩා වැටිලා තියෙනවා. එතනත් ගර්භනී මාතාවන්, පොඩි ළමයි ඉන්න තැනක්. ඒ වගේම එතනත් ලොකු අනතුරුදායක ස්ථානයක්. මේ දවස්වල අධික වැස්ස නිසා මට අද උදේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනී කෝල් එකක් දීලා, අද සභාවට මේ ගැන දැනුවත් කරන්න කිව්වා. මම සභාපතිතුමාට කියන්නෙ මේ ගැන අවධානය යොමු කරලා විසඳුමක් ලබා දෙන්න කියලා. ඇත්ත වශයෙන්ම අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්ව කතාව ඇත්ත. අපි සභික වශයෙන් මෙතනට එවලා අපෙන් යම්කිසි සේවයක් මහජනතාව වෙනුවෙන් බලාපොරොත්තුවෙන් තමයි අපි මෙතනට එවල තියෙන්නේ. ඉතින් ඇත්තටම ජනතාවට අපෙන් සේවයක් විය යුතුයි. ඒත් අපි මෙතනට ඇවිල්ලා ආපහු හැරිලා ස්වයංවිවේචනයක් කරලා බලන කොට, අපේ සභාවෙන් මහජනතාවට සිදු වෙලා තියෙන්නේ මොකක්ද? ඇත්තටම ඒ ගැන ලොකු කනගාටුවක් ඇතිවෙනවා. මිල මුදලින් නෙවෙයි, අපට කරන්න පුළුවන් සාමාන්‍ය සේවාවක් අපි කරලා තියෙනවාද කියලා බලන්න. ඒ වගේම සභාවට යෝජනා දීම මම නතර කරල තියෙන්නෙ. යෝජනා දුන්නත් යෝජනාවලට කිසිම පිළිතුරක් ලැබෙන්නේ නැහැ. ලැබිලත් නැහැ. ඉතින් මම හිතන්නේ ඉදිරියටත් මේ යෝජනා දුන්නත් අපට වැඩක් වෙන්නේ නැහැ. මම එක දවසක් යෝජනා දුන්නා. ඒ යෝජනා ඊට කලින් දීලා තියෙනවා කිව්වා. ඒත් මම හිතන්නේ එම යෝජනාවලින් එකම යෝජනාවයි ඊට ඉස්සෙල්ලා ඇතුල් කරලා තිබුණේ. වසන්ත ගනේවත්ත මහතාගේ නිවසේ සිට පඹගොඩ වතුරාව පාර සභාවෙ පාරක් ලෙස පවරා දෙන්න කියලා. අනිත් යෝජනා නම් මම ඉස්සෙල්ලා දීලා තිබුණෙ නැහැ. ඒ එක යෝජනාවක් මම දුන්නෙ ගම්මැද්දෙගොඩ පාලමෙන් තුන් දෙනෙක් ලිස්සා වැටිලා තියෙනවා. ඒ තහඩු ලිස්සන නිසා එතැනට විකල්පයක් යොදලා දෙන්න කියලා සභාවේ යෝජනාවක් කරල යවන්න කියල ඉල්ලා සිටිනවා. එතනදී ගාල්ල - මාපලගම පාරේ ගනේගොඩ පාලමේ කාපට් දාලා වගේ තියෙන්නේ. අන්න ඒ වගේ දෙයක් මෙතනටත් යෙදෙව්වොත් හොඳයි කියලා හිතනවා. ඒ ඉංජිනේරු ක්‍රමය හොඳයි කියන එක තමයි මගේ අදහස. මම ඒ යෝජනාව ගෙනාවෙ සභාවෙ යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්න. එයත් ප්‍රතික්ෂේප වෙලා තිබුණා. ඊට පස්සේ මම කිසිම යෝජනාවක් ගෙනාවේ නැහැ. අදත් මම මගේ ගෙවතු වගා තරගය ගැන වුණත්, ඒ ඉල්ලීම ඉටු කර දෙනවා කිව්වහම මට ගොඩක් සතුටු හිතුනා. අපි සභාවක් වශයෙන් එක එක මතිමතාන්තර දරලා, එක එක පක්ෂ වශයෙන් තමයි මෙතනට ඇවිල්ලා ඉන්නේ. ඒ වුනාට අපි කාගේත් එකම අධිෂ්ඨානය, එකම බලාපොරොත්තුව තමයි. හොඳම ප්‍රාදේශීය සභාව බවට පත්කිරීම. ඒ වගේම විගණන වාර්තා බැලුවොත් ඇත්තටම කනගාටුයි. අවුරුදු තුනක විගණන වාර්තා මම බැලුවා. ඉතින් මම හිතන්නේ අපේ සභිකවරු ඒ ගැන දැනුවත් වෙනවා නම් හොඳයි කියලා. විගණන වාර්තාවෙ ඉෂ්ට කරල නැති එකම කරුණක් අවුරුදු තුනේදී ම සටහන් වෙලා තියෙනවා. ඒ වගේම අවුරුදු තුන හතරක් ම එක ම දේ කරලා නැතුව මම හිතන විදියට කරුණු දහයක් විතර තියෙනවා. ගරු සභාපතිතුමනි, විගණන වාර්තා අධ්‍යනය කරලා, ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මේ සියලුම දේවල් යථා තත්ත්වයට පත් කරගෙන, හොඳ සභාවක් විදිහට ඉදිරියට ගෙන යන්න කියලා ඉල්ලා සිටිමින්, මම මගේ කතාව අවසන් කරනවා. සියලු දෙනාටම ස්තුතියි.

**ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිය පුද කරනවා. මොකද වීථි ලාම්පු ප්‍රශ්නේ දැන් ගොඩක් දුරට අවසන් කරලා තියෙන්නේ. ඒ වගේම ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. අර ගහ කපලා දෙන්න කියලා ඉල්ලීම් කරපු ආත්තම්මා නැවතත් මෙතනට ගෙන්නන්නෙ නැතුව, ඉතා ඉක්මනින් ගහ කපල ඉවත් කරලා දෙන්න කියන කාරුණික ඉල්ලීම කරන ගමන්ම, තව පොඩි ඉල්ලීමක් කරන්න තියෙනවා. තවත් වීථි ලාම්පු දෙකක් විතර අලුතින් සවිකර ගන්න තියෙනවා. ඒ දෙකත් සවි කරල දෙන්න කියල මම ඉල්ලීම් කරනවා. ගරු සභාපතිතුමනි, එක්සත් ජාතික පක්ෂය විසින් සන්ධාන ගත වෙන්න තිබුණ දිනය පවා

වෙනස් කරලා, සන්ධාන ගත කරන්න බැරි තත්ත්වයකට පත් වුන අවස්ථාවක, එක්සත් ජාතික පක්ෂයට, පක්ෂයේ අපේක්ෂක යෝජනා කරගන්න බැරි වෙලාවක, මහින්ද රාජපක්ෂ මැතිතුමා රට නිදහස් කරල දුන්න නායකයා විදියට, දෙයක් කිව්වොත් ඒ දේ හරිහැටි කරන නායකයා විදිහට, අපට 11 වෙනිදා අපේ පක්ෂයේ අපේක්ෂකයා නම් කරනවයි කිවුවා. ඒ විදිහටම එකොළොස් වැනිදා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාව නම් කළා. මම හිතන්නේ එක්සත් ජාතික පක්ෂය මේ වෙලාවේ ලොකු අර්බුදයකට ලක්වෙලා ඉන්නේ. මොකද සන්ධානයක් හදා ගන්න බැරුව. දිනයක් යොදා ගන්න බැරුව ඉන්න වෙලාවක මම එතුමන්ලට කියන්න කැමතියි. අපි මෙතනට ආවේ අපේ ගම්වලට යම් දෙයක් කරන්න. නමුත් සභාපතිතුමනි, අපි මේ යහපාලන ආණ්ඩුව තුළින් කිසිම දෙයක් කෙරෙන්නෙ නැති වෙලාවක, අපි ඉදිරි මාස හත අට ගියාට පස්සේ අපේ ආණ්ඩුවක් තුළින් අපට යම් සාධාරණයක් වෙයි කියලා බලාපොරොත්තු වෙනවා.

ඒ වගේම ජයවීර මන්ත්‍රීතුමාලගෙ අපේක්ෂකයා 18 වෙනිදා නම්කරන අවස්ථාවේ, මම හිතන්නේ එක්සත් ජාතික පක්ෂයට ඒකත් සුභ වේවි. මොකද එක්සත් ජාතික පක්ෂයත්, ජනතා විමුක්ති පෙරමුණත් එකතුවෙලා යහපාලනයක් ගෙනැල්ලා රට විනාශය කරා ගිහිල්ලා, දැන් ජනතා විමුක්ති පෙරමුණේ ජයවීර මන්ත්‍රීතුමාගේ කටින්ම එක්සත් ජාතික පක්ෂයට චෝදනා කරනවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ජනාධිපති වුණාට පස්සේ ස්ථිර වශයෙන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමා අගමැතිතුමා වුණාට පස්සේ, මම හිතන්නේ එක්සත් ජාතික පක්ෂයකටවත්, ජනතා විමුක්ති පෙරමුණටවත් කවදාවක්වත් කට හොල්ලන්න බැරි තත්වයට පත්වේවි. ගරු සභාපතිතුමා, වීථි ලාම්පු විතරක් අපට දෙන්න. අපි වැඩියෙන් දේවල් ඉල්ලන්නේ නැහැ. මොකද අපේ ආණ්ඩුවක් ආවම මේ වගේ ජරා විදිහට සමෘද්ධිය හදන, කුහක විදියට මහින්ද මහත්තයා වැඩ කරන්නේ නැති බව අපි දන්නවා. ඒ නිසා අපි එක්සත් ජාතික පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ අපි එකතුවෙලා සියලුම මන්ත්‍රීවරුන් එකතු වෙලා වැඩක් කරමු යන කාරුණික ඉල්ලීම කරමින්, අනිවාර්යයෙන්ම 2020 අපේ ආණ්ඩුවක් පත්වෙන බවත්, ඔබතුමාලා කිරිබත් කන්න සූදානම් වෙලා ඉන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලාගෙන්, හා ලේකම්තුමිය ප්‍රධාන සභාවේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාගෙන් අවසරයි. පළමුවෙන්ම සිහිපත් කරනවා ගරු සභාපතිතුමනි, සභාවේ කටයුතු පිළිබඳව මේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් විවිධ අදහස් ප්‍රකාශ කළා. ඇත්තටම ඒ ගැන කණගාටු වෙනවා. අර පිටිපස්සේ රථගාල දිහා බැලුවාම එතනින් අපට සභාවේ තියෙන පිළිවෙල ගැන හිතාගන්න පුළුවන්. සභාපතිතුමා ඔබතුමා ගිහින් බලන්න අර බයිසිකල් ටික නවත්තලා තියෙන විදිය. අඩුගානේ එහා පැත්තෙ තියෙන ටොයිලට් එකට වත් යාමේ හැකියාවක් නැහැ. ඒ නිසා ඔබතුමාට හැකිනම් බයිසිකල් නවත්තන්න හැකියාවක් තියෙන විදියට ඉරි ටිකක් හරි ගහලා ක්‍රමවත් විදියට සකස් කරන්න. මොකද පිටිපස්සේ තියෙන බයිසිකලයක් ගන්න ගියහම ගොඩක් අපහසුයි. අපට නම් මේ ක්‍රමය කමක් නැහැ. නමුත් සභාවට පිටින් ආපු කෙනෙක් මේවා දැක්කම සභාවේ තියෙන තත්ත්වය හොඳට පැහැදිලි වෙනවා. ඒ වගේම අපි මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම පසුගිය කාල වකවානුව තුල යම් යම් දේවල් කතා කලා. අපි මන්ත්‍රීවරු වශයෙන් විලේගේ සභාපතිතුමාගේ කාලයේදීත්, දැන් ඔබතුමාගේ කාලයේදීත් හිටියා. මේ කාල දෙකේදීම මාධ්‍යවේදීන් මේ සභා රැස්වීමට පැමිණියා. අපේ ගම් වල අඩුපාඩු පිළිබඳ පත්තර වල සඳහන් වුණා. නමුත් දැන් මාස කිහිපයක ඉඳලා මාධ්‍යවේදීන් අපේ සභාවට නොඑන තත්ත්වයක් තමයි තියෙන්නේ. අපිට මිනිස්සු ඡන්දෙ දීලා මෙතනට එවලා, ගමේ දේවල් වෙනුවෙන් අපි මෙතන කතාකරනවා කියලවත් මිනිස්සු දැනගන්න නම් මේවා පත්තරවල පළ වෙන්න ඕන. එහෙම පළවුනොත් ඒකෙන් අපට යම් හෝ අස්වැසිල්ලක් තියෙනවා. ඒ නිසා ඔබතුමා ඒ ගැන සැලකිලිමත් වෙලා ලබන සභාවාරයේ ඉඳලා හරි මාධ්‍යවේදීන් දෙන්නෙක්,

තුන්දෙනෙක් මේ සභාවට ගෙන්නලා, ඒ අයගේ සහයෝගය ලබාගන්න. අපේ මැති ඇමතිවරු හරි මෙවැයි තියෙන අඩුපාඩු දැක්කම, කුමන හෝ පැත්තකින් අපට සාධාරණයක් සිද්ධ වේවි. ඒ නිසා ඒ කටයුත්ත කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒවගේම සභාපතිතුමනි, මාපලගම මංසන්ධිය පිරිසිදු කරන අපේ වයසක සීයා ගැන මම කිහිප වතාවක්ම කිවුවා. ඒ ගැන යම් තීරණයක් ගන්න. මොකද, එතුමා දැන් බොහොම බොහොම අයෝබලයි. වෙළඳ ප්‍රජාවත් කියන්නේ, සමහර කඩවල් වල පිරිසිදු කිරීම් කරන්නේ නැහැ කියලා. අනික ඒ මනුස්සයට කරන්නත් බැහැ. ඒ නිසා ඒ මිනිස්සු කරදර කරන්නෙත් නැහැ. ඒ නිසා ඒ මනුස්සයාගේ වයස ගැන බලලා, ඔහු තියාගන්න ඕන නම්, මේ සභාවේ මිදූල අතුගාන්න හරි තියාගන්න. ඒ කටයුත්ත කරන්න පුළුවන් කෙනෙක් එතනට යොදවන්න කියලා මම ඉල්ලා සිටිනවා. ඔබතුමා කියනවා නම් එතන වැඩ කරන්න හෙට වුණත් කෙනෙක් හොයල දෙන්නම්. ඒ වැඩ කරන්න පුළුවන් ද්‍රවිඩ මිනිස්සු ඉන්නවා. අපට එතුමා පිළිබඳ ගැටළුවක් නැහැ. ඇත්තටම එතුමා පව්. ඒ වයසක මනුස්සයටත් ජීවත් වෙන්න කීයක් හරි ඕන. නමුත් එහෙමයි කියලා හැමදාම එහෙම වැඩ කරන්න බැහැ. එහෙම වුනහම මාපලගම මිනිස්සුන්ගෙන් අපට එන්නේ චෝදනා ගැරහිලි විතරයි. අපි මාපලගම කඩේකට ගියහම, අන්න ඔබතුමාලගේ සභාවෙන් කරන හැටි කියලා අපට තමයි අඩුපාඩු පෙන්නන්නෙ. ඒ නිසා හැමදාම අපට මේවා අහන්න දෙන්න එපා. ඉස්සරනම් මාපලගම ඒ මනුස්සයත් එක්ක මුරකාරයෙක් හිටියා. දැන් තියෙන ආර්ථික තත්වෙත් එක්ක මුරකරුවෙක් දාන්න අමාරුයි කියලා අපි දන්නවා. ඔබතුමාගේ කාලේ නෙවෙයි ඊට කලින්, විලේගේ සභාපතිතුමාගේ කාලයේ තමයි මුරකාරයා අයින් කළේ. අපි ඔබතුමාට වැරැද්දක් කියන්නේ නැහැ. දැන් මාපලගම නගරය යහපත් තත්වයකට පත්වෙලා තියෙනවා. නමුත් තව ගොඩක් දේවල් කරගන්න තියෙනවා. දැන් වීථි ලාම්පු ටික දාලා හොඳට එළිය තියෙනවා. නමුත් මෙන්න මේ මම කියපු අඩුපාඩුවත් නැතිකරගන්න. ඒ වගේම ආයුර්වේද පැත්ත ගැන කතා කරනවා නම්, ඒ පැත්තෙන් ගොඩක් අඩුපාඩු තියෙනවා. සමහර මිනිස්සු බෙහෙත් ගන්න ආවම, අපට කියනවා. මහත්තයෝ, අද බෙහෙත් ගන්න විදියක් නැහැනේ. බෙහෙත් දෙන්න කවුරුත් නැහැ. ආදී දේවල්. ඉතින් ඒව ගැන ඔබතුමා සැලකිලිමත් වෙන්න. ඒ වගේම ඇඟිලි සලකුණු යන්ත්‍රයක් සවි කරපු එකත් හොඳයි. නිලධාරියෙක් යම් සේවාවක් කරන්න බැඳිලා ඉන්නවා නම් ඒ කටයුත්ත හරියට කරන්න ඕන.

ඒවගේම සභාපතිතුමා, ඔබතුමාට ආරංචිත් ඇති මාපලගම ආදර්ශ ගම්මානයේ අපේ සභාව සතු පොදු සුසාන භූමියට අයිති ඉඩමේ, අනවසරයෙන් පස් කැපීම මහා ජාවාරමක් විදියට පහුගිය දවස්වල සිදු කෙරුණා. සමහර වෙලාවල්වලදී මෙය ගුටිකෙලි බවටත් පත්වුණා. සභාවේ සභාපතිතුමා සති කීපයක් ගියාට පස්සේ තමයි මේ කටයුත්ත දන්නෙ. තේ තවාන් වලට පස් කපලා මහා පරිමාණයෙන් ජාවාරමක් හැටියට, නාගොඩ විතරක් නෙවෙයි. නියාගම ප්‍රාදේශීය සභාවෙත් මිනිස්සු ඇවිල්ලා පස් කපාගෙන ගිහිල්ලා තියෙනවා. ඉතින් අපි කරන්න ඕන දැනුවත් කිරීම ඔබතුමාට කලා. නමුත් දැනටත් එය මද පමණින් සිදු වෙන බවට ආරංචි තියෙනවා. ඒකට කරන්න ඕන පිළියමත් මම ඔබතුමාට කිව්වා. සභාවේ සභාපතිතුමා හැටියට, අපේ දේපළ ආරක්ෂා කරගන්න ඕන. ඒ පිළිබඳව නැවත වාරයක් මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ පැත්තෙත් ඔබතුමාලගේ මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා. නමුත් එතුමන්ලා ඒවා සඳහන් කරාද කියලා මම දන්නේ නැහැ. නමුත් සභාවේ නම් කතා කරේ නැහැ. ඇත්තටම මේක සෙල්ලමකට හිතාගෙන ඉන්නවා. අන්තිම මහා වළක් තමයි අපිට ඉතුරු වෙන්නේ. මේ රටේ නීතියක් තියෙනවා. ඒ නීතිය අනුව කටයුතු කරන්න ඔබතුමාට අවශ්‍ය බලතල ලැබිලා තියෙනවා. ඔබතුමා මේ රටේ ඉන්න ප්‍රධාන බලතල ඇති පුරවැසියෙක් හැටියට, ඒ කටයුත්ත ඔබතුමාට කරන්න බැරි ඇයි? මම දන්නෙ නැහැ. ගමේ මිනිස්සු එක එක වෙන වෙන කතා කියනවා. මම ඒ කතා මෙතන කියන්න යන්නේ නැහැ. ඒ නිසා එහෙම නොවෙන විදියට තමුන්නාන්සෙ වැඩකටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. මම සභාපතිතුමාට යෝජනා කළා. නියාගම ප්‍රාදේශීය

සභාවේ මැෂින් එකක් තියෙනවා. ඒ මැෂින් එක ගෙනැල්ලා, කානුවක් කපලා, සකස් කරන්න කියලා. නමුත් අද වෙනකන් ඒ වැඩේ කලේ නැහැ. ඒ වගේම තමුන්නාන්සේලාගේ පාර්ශවයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ පිළිබඳව කතා කලෙත් නැහැ. අදට මාස දෙකකට ආසන්න කාලයක් ජාවාරම කරගෙන යනවා. දැන් මේ කතාවලින් මටත් තේරෙනවා. තමුන්නාන්සේලාත් මේකෙ කොටස්කාරයන් කියලා. මම දන්නේ නැහැ. තොප්පිය හරි නම් දාගන්න. මේකට විරුද්ධව කටයුතු නොකරනවා නම්, තමුන්නාන්සේලා මේ කොටස්කාරයෙක් කියලා තමයි මම කියන්නේ. නැත්නම් මොකද මේකට විරුද්ධව ක්‍රියාමාර්ගයක් ගන්නෙ නැත්තෙ. මේ ගැන දීර්ඝව කතා කරල වැඩක් නැහැ. මේකෙදි ගමේ ඉන්න මිනිස්සුන්ගෙන් බේරෙන්න බැහැ. තමුන්නාන්සේලා සභාවේ මන්ත්‍රීවරුන් නේද? ගිහිල්ලා මේ ගැන කතා කරන්න කියලා. ඉතින් මේ සභාවෙ තමුන්නාන්සේලාගේ බලය තියෙන්නේ. තමුන්නාන්සේලට ඕන දෙයක් කරන්න පුළුවන්. අපි අනුන්ගේ බලය අතට අරගෙන වැඩ කරන්න යන්නේ නැහැ. ගරු සභාපතිතුමා, අපට සභාවේ බලය තිබුන නම්, අපි දන්නවා කරන වැඩේ. දැන් ඔබතුමාලට තමයි බලය තියෙන්නේ. ඒ නිසා ඔබතුමන්ලා ඒ ටික කරගන්න.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මාපලගම මහජන ක්‍රීඩාංගනයේ ලෝක ළමා දිනය වෙනුවෙන් කානිවල් එකක් පවත්වනවා කියලා කිව්වා. අපේ සභාවේ ළමයින්ටත් කානිවල් එකේදි ගල් වලිනුත් මොනව හරි සෙල්ලමක් කරන්න පුළුවන් වේවි. මොකද පිට්ටනියෙන් කාලක් විතර ගල් ගොඩගහලා තියෙනවා. ඒ වගේම මේ සඳහා ලක්ෂ තුනකට ආසන්න මුදලක් වැය කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ වැය කරන මුදල ටිකට්වලින් සභාවට ලැබෙනවා. ඉතින් මම හිතන්නේ මේ වෙලාවෙදි, අපේ විදුහල්පතිතුමා කිව්ව වගේ, මේ කානිවල් එකට වැඩිය ළමයින්ට වැදගත් වන වැඩසටහන් අපි පසුගිය අවුරුදුවල මේ සභාව හරහා කලා. ඇත්තටම නිදහසේ, නිස්කලංකව ඒ දරුවෝ ඒ වැඩසටහන් රසාස්වාදනය කරලා යම් සතුටක් ලැබුවා. මම හිතන්නේ මේ වැඩසටහන තුළ ඔබතුමා බලාපොරොත්තු වන මෙරිගෝ රවුන්ඩ් ආදී ක්‍රීඩා භාණ්ඩවල සෙල්ලම් කරන්න අවස්ථාව ලැබෙනවා ඇති. නමුත් මම හිතන විදියට දරුවන් සහ දෙමව්පියන් එක තැනකට එකතු කරලා කරන වැඩසටහන විතර වැදගත් වෙන එකක් නැහැ කියල තමයි මගේ අදහස. ඒ නිසා මම නැවත වාරයක් ඔබතුමාට කියනවා. අපි වෙන අවුරුදුවලදී සිදු කළා වගේ, අපේ වෙනම ශාලාවක් උඩුගම තියෙනවා. ඒ වගේ තැනකට ගිහිල්ලා, ගුණාත්මක බවින් ඉහළ වැඩසටහනක් කරන්න පුළුවන් නම් හොඳයි කියලා. ඒ වගේම ලැබෙන ආදායම අපේ සභාවට එකතු කරගන්න. මොකද සභාවේ ආර්ථික තත්ත්වය ඉතාමත් පහළ මට්ටමක තමයි තියෙන්නෙ. වෙනදනම් 100000 ක් 75000 ක වගේ මුදලක් තමයි වැය කළේ. ඒ නිසා සභාවේ තියෙන තත්ත්වයත් එක්ක, එවන් ලොකු මුදලකට යන එක ගැටලුවක් වන බව මතක් කරනවා. ඒ වගේම අපේ හිටපු සභාපති සහබන්දු මැතිතුමා ප්‍රකාශ කළා. ඉදිරි ගෙවීම් ශේෂය දිහා බැලුවම, අපට වියදම කොපමණද කියලා හිතාගන්න පුලුවන්. ඒ වගේම අතිකාල දීමනා වැනි ගෙවීම් සඳහා විශාල මුදලක් වැය වෙනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මේ වෙලාවෙ අපේ ලක්රුවන් මන්ත්‍රීතුමාත්, හැමෝමත් මේ රටේ තියෙන තත්ත්වය ගැන කතා කළා. මම මේ වෙලාවෙ අපේ දිස්ත්‍රික්කයේ නායක, පලාත් පාලන හා පළාත් සභා අභ්‍යන්තර කටයුතු ගරු අමාත්‍ය වජිර අබේවර්ධන මැතිතුමන්ට මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මොකද ගාල්ල දිස්ත්‍රික්කයේ තියෙන සියළුම ප්‍රාදේශීය සභාවන්ට සංවර්ධන කටයුතු සඳහා අති විශාල මුදලක් යොදවලා තියෙනවා. මේ වන විටත්, අපෙන් ඇස්තමේන්තු සකස් කරන්න අවශ්‍ය ලේඛන අපට එවලා තියෙනවා. ඒ වගේම සංවර්ධන කටයුතු වෙනුවෙන් එක්කෝටි විසිපන් ලක්ෂයකට ආසන්න මුදලක් නාගොඩ ප්‍රාදේශීය සභාවට ඇවිල්ලා තියෙනවා. ගරු සභාපතිතුමනි, මේ සංවර්ධන යෝජනා අපි ලබාදීලා තියෙන්නේ, මේ සංවර්ධන කටයුතු කරනවිට මේ යෝජනා ක්‍රියාත්මක විය යුත්තේත් අපි හරහායි. හැබැයි දැනටත් යෝජනා තුනක් ක්‍රියාත්මක වෙච්ච බවට අපට ආරංචි මාර්ග ආවා. මේ යෝජනාවන් ක්‍රියාත්මක වෙනකොට, අපේ සභාවේ අපේ මන්ත්‍රීවරු ඉන්නවා.

ඒ අයත් දැනුවත් විය යුතුයි. මොකද අපි විසින් සභාවේ මන්ත්‍රීවරුන් හැටියට, ගරු අමාත්‍යතුමන් දැනුවත් කරලා, අපට ප්‍රාදේශීය සභාව හරහා යම් වැඩ කොටසක් කරන්න ඕනෙයි කියලා ඉල්ලීමක් කළා. ඒ සඳහා අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් එවලා තියෙනවා. තවත් ඉදිරියේදීත් එනවා. ඒ වගේම එතුමන්ගේ මැදිහත්වීමෙන් සභාවට අවශ්‍ය, සභාවේ අපි දීර්ඝ කාලයක් තිස්සේ ඉල්ලුම් කරපු, පසුගිය ප්‍රාදේශීය සභා කාලය තුළත් සිහින මවමින් හිටපු වැඩසටහන් ගානකට අතිවිශාල මුදල් කන්දරාවක් ලබා දීලා තියෙනවා. ඉතින් මං හිතන්නෙ මේ වෙලාවේ ඒ පිළිබඳ පැහැදිලි කිරීම් කරන්නේ නැහැ.

ඒ වගේම තමුන්නාන්සේලා පසුගිය කාලේ, ගමට ගිහිල්ලා ආණ්ඩුවේ බලය ලබාගන්නවා කියලා බොරු කියලා, මිනිස්සු රවට්ටලා, ඡන්දය අරගත්තට, තමුන්නාන්සේලා දැනගත්තා මේක අරගත්තට කරන්න බැරිය කියලා. හැබැයි එහෙමයි කියලා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව, එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ නායකතුමා, තමුන්නාන්සේලා දිහා අහක බැලුවෙ නැහැ. පොහොට්ටුවේ ද, ශ්‍රී ලංකා එකේද, යූඇන්පී එකේ ද තියෙන්නෙ කියලා බැලුවෙ නැහැ. සභාව ඉදිරියට ගෙනියන්න අවශ්‍ය පහසුකම් ලබා දුන්නා. ඒ වෙනුවෙන් අපේ පක්ෂයේ නායකතුමාට මම මගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මොකද දුර දක්නා බුද්ධියක් තියෙන නායකයෙක් හැටියට එතුමන් අපට අවශ්‍ය පහසුකම් සලසා දුන්නා. නැත්නම් තමුන්නාන්සේලා කතා කළාට, කෑ ගැහුවට වැඩක් නැහැ. අපේ ධනංජය මන්ත්‍රීතුමා, අපි දන්නවා තමුන්නාන්සේලාගේ පියතුමා සභාව කරන කාලේ කොහොමද වුණේ කියලා. එතුමා ජීවතුන් අතර නැති වුනත්, අපි එතුමාට ගරු කරනවා. මාත් එක්ක සභාව තුළදී ගොඩක් හැප්පිච්ච කෙනෙක් හැටියට තමයි මම අද කතා කරන්නේ. යම් යම් ව්‍යාපෘතිවලට ලක්ෂ ගණන් සල්ලි දානකොට, ඒ සල්ලි යොදවන්න එපා කියලා අපි කෑ ගැහුවා. එහි අයිතියක් නැහැ කියලා අද සභාවට විරුද්ධව නඩු දාලා තියෙනවා. එහි ප්‍රතිඵලය වුනේ රජයේ මුදල් කෝටි ගාණක් නැති බංගස්තාන වුන එක. මේ වගේ දේවල් තමයි ඒ කාලයේදී වුණේ. නමුත් අද මේ ආණ්ඩුවට පින්සිද්ධ වෙන්න සියලු ව්‍යාපෘති කරනකොට, ඒ ඉඩමේ අයිතිය ඒ රජය සතු විය යුතුයි. අයිතිය තහවුරු කරන්නේ නැත්නම්, ඒ මුදල් සංවර්ධන කටයුතු වලට යොදන්න දෙන්නේ නැහැ. ඒක තමයි කෙරෙන්න ඕන.

ඒ වගේම ජනාධිපති අපේක්ෂකයා පිළිබඳ ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා. ඉදිරියේදී ජනතාව ඉල්ලන්නේ කවුද කියලා ඔබතුමාලට බලාගන්න පුළුවන්. ඒ ඉල්ලන නායකයා ඉදිරියේදී එනකොට බලාගන්න පුළුවන්. තමුන්නාන්සේලාගේ ඔය ගෝඨාභය රාජපක්ෂ නායකතුමා ගැනත් පොඩ්ඩක් මතක් කරන්න ඕන. තමුන්නාන්සේට 2015-01-08 ට පෙර තිබුණ පාලන කාලය පිළිබඳවත්, යුද්ධ කාලය පිළිබඳවත් මතක නැතිව ඇති. හැබැයි ඒ ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කරපු කියුම්, කෙරුම් පිළිබඳ කිව්වොත්, අපිට දවසක් දෙකක් කතා කරන්න වේවි. එතුමා පිළිබඳව විවිධ මතිමතාන්තර තියෙනවා. ඉදිරියේදී මාධ්‍ය තුලින්, සංවාද තුළින් එය දැනගන්න හැකි වේවි. 2020 දී එතුමාට බලය ගන්න පුළුවන් කියලා කියන එක සිහිනයක්. කවදාවත් වෙන්නේ නැහැ. උතුරට ගියාට පස්සේ, දකුණට ගියාට පස්සේ මිනිසුන්ගේ කතාවලින් අපි දන්නවා. හොඳම වෙලාවට ගෝඨාභය මහත්මයා ඒ පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයා හැටියට තෝරා පත්කරපු එක ගැන අපි සතුටු වෙනවා. මොකද අපේ අපේක්ෂකයාට ඉහළින්ම ජයග්‍රහණය කරන්න පුළුවන් වටපිටාවක් මහින්ද රාජපක්ෂ මහත්මයා හදලා දීපු එක පිළිබඳව. ඒ නිසා තමුන්නාන්සේලාගේ සිහින 2020දි ඉෂ්ට කරගන්න හැකියාවක් ලැබෙන්නේ නැහැ. මම කලින් කිව්වා වගේ, එක් කෝටි විසි පන් ලක්ෂයක මුදලක් සංවර්ධන යෝජනා එනවා. මේවා ඇස්තමේන්තු කලායින් පස්සේ, ඒ අවශ්‍ය කටයුතු අපි විසින් සිද්ධ කළ යුතුයි. පාරවල්වල වැඩකටයුතු කරනවා. ඒ කාලේ වුණත් අපේ ගල්වාන - උඩුගම මාර්ගය, මාපලගම - පනංගල පාර යන පාරවල්වල යන්න බැහැ. අලි වළවල් තිබුණේ. නමුත් 2015 ජනවාරි අට වැනිදායින් පස්සේ මේවා යථා තත්ත්වයට පත්වෙලා. හොඳට ගමන කරන්න පුළුවන් තත්ත්වයට අපි හදා ගත්තා.

හැබැයි අද වන විට මේවා අමතක වෙලා තියෙනවා. අපේ ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා ඉන්නවා. අපේ පුස්සැල්ලකාර ඇළ හාරලා, ලක්ෂ ගානක් වියදම් කලා. ඒ මුදල එතුමන්ලගේ කාලේ ඇස්තමේන්තු කරලා තිබුණා. මිනිස්සු විශාල ප්‍රමාණයකගේ ඉල්ලීමක්. පහුගිය ආණ්ඩුව කාලේ ආරම්භ කරලා තිබුණු ඒ වගේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් සිදු කළා. පළාත් සභාවෙ සල්ලි ද, මධ්‍යම රජයෙ සල්ලිද කියලා අපට අදාළ වෙන්නේ නැහැ. කොතනින් ආවත් අපේ ගරු අග්‍රාමාත්‍යතුමා නායකත්වය දරන මහා භාණ්ඩාගාරයෙන්, මධ්‍යම රජයෙන්, සභාවට වෙන් කරන්නේ. පළාත් සභාවේ සල්ලි නෙවෙයි. සභාපතිතුමා වැරදි අර්ථකථන දෙන්න එපා. මහා භාණ්ඩාගාරයෙන් පළාත් සභාවට දීලා පළාත් සභාවෙන් තමයි මෙතනට එන්නෙ. පළාත් සභාවේ වුනත්, මධ්‍යම රජයෙ වුනත්, කොයි එකත් සල්ලි තමයි. ඉතින් ඒක ආණ්ඩුව යටතේ තමයි සිද්ධ වුණේ. සභාපතිතුමනි එක්කෝටි විසිපන් ලක්ෂයක් සභාවේ ව්‍යාපෘතිවලට මුදල් දුන්නා. ආදාහනාගාරය හදන්න කෝටි දෙකක් දුන්නා. ඒවත් පළාත් සභාවේ සල්ලිද? ආණ්ඩුවෙන් උදව් කරද්දී ඔබතුමාලා පිළිගන්නෙ නැත්නම් කරන්න දෙයක් නැහැ. ඔබතුමාලා පළාත් සභාවේ සල්ලි, අර සල්ලි, මේ සල්ලි, කියලා වැරදි විදිහට අර්ථකථනය කරන්න හදනවා. ඔබතුමාට බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කරන්න අපි උපරිම සහයෝගය දෙනවා. ආදහනාගාරය හදන්න ඔබතුමාට ඉඩමක් නැතුව හිටියෙ. ගයන්ත මැතිතුමා හරහා ඒ සියල්ල අපි සිද්ධ කරල දුන්නා. අපි සභාවේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු හැටියට මේ වගේ දැවැන්ත සහයෝගයක් ඔබතුමාට ලබා දෙන ගමන්, ඒ පිළිබඳ අපි කතා කරන්නත් ඕන. නැත්නම් අපි කතා නොකර උදව් කරලා වැඩක් නැහැ. කරන්නේ මොනවද කියලා මේ අය දැනුවත් කරන්න ඕන. නැත්නම් ඔබතුමාගේ මන්ත්‍රීවරු හිතන් ඉන්නේ මේ උඩින් පහත් වෙනවා කියලා. ඒ වගේම ජනතාව ඉල්ලන, රට ඉල්ලන හොඳම නායකයා ජනාධිපති අපේක්ෂක හැටියට නුදුරු දිනයක එනවා. ලබන අවුරුද්දේ මීට වැඩිය දැවැන්ත වැඩසටහන් මේ වත්මන් රජය හරහා ක්‍රියාත්මක වෙනවා. ගමට යන්න බැරිව හිටිය තමුන්නාන්සේලට ඒ සඳහා අවකාශය, වටපිටාව අපේ ආණ්ඩුවේ, අපෙ නායකයෝ, අපේ පක්ෂ නායතුමා හරිගස්සලා දෙනවා. එනිසා තමුන්නාන්සේලා කිසි දේකට බය වෙන්න එපා. ගමේ තියෙන සියලුම අවශ්‍යතාවයන් අපේ නායකතුමා විසින් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාට තියෙන එකම දේ තමයි, කරන්න තියෙන එකම දේ තමයි ලබන ජනාධිපතිවරණයට අපේ අපේක්ෂකතුමා ඉදිරිපත් කරාට පස්සේ එතුමාට සහයෝගය දෙන්න. එතකොට තමයි තමුන්නාන්සේලගේ ඉදිරි බලාපොරොත්තු ටිකත් ඉෂ්ට සිද්ධ කරන්න හැකි වෙන්නේ. මගේ කතාව මෙතනින් අවසන් කරනවා. ඔබ සැමට ස්තුතියි.

**ගරු මන්ත්‍රිනි කේ.කේ.අයි. නෙරන්ජලී මහත්මිය**

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම ප්‍රථමයෙන්ම මතක් කර සිටිනවා. අපේ ලක්රුවන් සම්පත් මහත්මයා ඉල්ලා සිටියා. ගල්ලෙනමුල්ලේ අලුතෙන් කොන්ක්‍රීට් දාන මාර්ගය පුළුවන්නම් වෙනස් කරගන්න කියලා. මේ වන විට ඒ පාරට ඇස්තමේන්තු හදලා ඉවරයි. ඒක නිසා මේකට සංශෝධන ගියොත් ඒ කාර්යය තවත් පහුවෙනවා. ඒ නිසා මම එතුමට මතක් කර සිටිනවා. දැන් අපි නම් කරපු පාරම හදමු කියලා.

අනිත් කාරණය තමයි. පසුගිය දිනක සුමනසිරි මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදන යටතේ, මම පාරක් සංවර්ධනය කළා. ඒ සංවර්ධනය කරපු දිනයේම, ඒ ඩෝසර් වැඩ කරන මහත්මාට මගේ අතින් ඒ ප්‍රතිපාදන මුදල් රුපියල් විසිදාහක් ලබා දුන්නා. නමුත් මම දන්නේ නැහැ. ඔබතුමාලට එතනට බිලක් ඇවිල්ලා, ඒ සල්ලි ගන්න සභාවට දාන්න ඕන කියන එක. නමුත් අද වන තුරුත් මට ඒ බිල දෙන්න බැරි වුනා. ලබන සභාවාරයට තමයි ඒ බිල ඉදිරිපත් වෙන්නේ. මම ඒ පාර සංවර්ධන කටයුතු කළේ ගිය මාසෙ දාහත් වැනිදා. ප්‍රමාද වුණේ මගේ නොදැනුවත්කම නිසා. අනිත් එක තමයි වසන්ත කුමාරගේ මන්ත්‍රීතුමා කිව්වා වජිර අබේවර්ධන මැතිතුමාගෙන් ලක්ෂ 6ක මුදලක් පාරවල් සංවර්ධනයට දාලා තියෙනවා කියලා. ඒ ගැන මම එතුමාට ස්තූතිවන්ත වෙනවා. ඒ වගේම පසුගිය

දිනෙක අපි අරලියගහ මන්දිරයේදී, අගමැතිතුමා විසින් අපි සියලු දෙනාටම අවශ්‍ය සංවර්ධන යෝජනා වලට යොදවන්න කියලා රුපියල් ලක්ෂ පහක මුදලක් ලබා දුන්නා. ඒ ගැනත් අපි එතුමට ස්තුතිවන්ත වෙනවා. මොකද අපේ ගම් වල සංවර්ධන කටයුතු කරන්න අපට අපේ රජයෙන් මුදල් ලබාදෙනවා. අපි ගන්න වැටුපට, අපි ගමට ණයක් වෙන්නේ නැහැ කියලා හිතනවා. මොකද අපි කැඳවන සෑම අවස්ථාවකදිම සහභාගි වෙලා, ඒ ලැබෙන ආධාර, ණය මුදල් ගමට අරගෙන යනවා. අනිත් එක තමයි අපේ ලක්රුවන් සම්පත් මන්ත්‍රීතුමාගේ නඩුව පිළිබඳව මම ගියවරත් කතා කළා. එතුමට පුළුවන් තරම් සහනයක් ලබා දෙන්න කියලා අදත් කියනවා. මොකද තව මාසයක් ගියත් තවම ඒ ගැන විශේෂ දෙයක් සිදුවෙලා නැහැ. එතුමා ඒ නඩුව නිසා සෑහෙන පීඩනයකට පත් වෙලා ඉන්න බවත් මතක් කරමින්, මගේ කතාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, මම නැගිට්ටේ දීර්ඝ වශයෙන් කතා කරන්න නෙවෙයි. අපේ වනමල් මන්ත්‍රීතුමා කුරුඳුවත්තෙ ඉපදිලා, කුරුඳුවත්තේම ජීවත්වන එතුමා පාර්ලිමේන්තුවේදි කියන්න ඕන ටික කිව්වා. අපි එතුමාට සුබ පතනවා. ඉදිරි අනාගතයේ මම හිතන්නේ, අපි විශිෂ්ට ජයග්‍රහණයක් කරා යන ගමන අබියස ඉන්න මේ අවස්ථාවේ, අපි බලාපොරොත්තු වුණා. හදවතේ නායකයා, ජනතාව ඉල්ලුවා. ජනතාව ඉල්ලන නායකයා අපට ලැබුණා. අපේ අපේක්ෂකයා වශයෙන් එතුමාගේ ජයග්‍රහණයට අපි සුභ පතමින් ඔබ සැමට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මගේ කතාව මෙයින් අවසන් කරනවා.

**ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි මේ වෙලාවේ හැටියට අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා ඉන්න වෙලාවක්. නමුත් ප්‍රකාශ කළ යුතු දේ ප්‍රකාශ කළයුතු නිසා, කෙටියෙන් හෝ පණිවිඩය දෙන්න ඕන. අපි සියලු දෙනාම දැන් මැතිවරණයක් ගැන තමයි කතා කර කර ඉන්නේ. ඒ මැතිවරණයට මුහුණ දීමට මේ මොහොත වෙන විට වත්මන් ආණ්ඩුව පසුතලය සකස් කරලා හමාරයි. ඒකට හේතුව තමයි. එදා ඉතිහාසයේ සිට මේ දක්වා සභාවේ සභාපතිවරුන් හැටියට වැඩ කරපු අපි සභාපතිවරු කිහිප දෙනෙක් ඉන්නවා. එදා අපට පාලක පක්ෂය එක පැත්තකුත්, රජය තව පැත්තකුත් ගත් අවස්ථා තිබුණා. ඒ මොහොත වන විට මේ සභාවට ඔය මුද්දර ගාස්තුවවත් හරියට ලබා ගන්න බැරි වුණා. කුඩම්මගේ සැලකිලි තිබිච්චි යුගයක් තිබුණා. ඉතිහාසය ගැන දන්නේ මෙතන ඉන්න කිහිපදෙනයි. එකෙනුත් ඉතාමත්ම දුෂ්කර ම කාලේ තමයි මම සභාපති වෙලා හිටිය කාලය. මොකද අපේ ආණ්ඩුව තිබුණේ අවුරුදු දෙකයි. පළාත් සභාව අපට නැහැ. ප්‍රාදේශීය සභා විතරයි තිබුණේ. අපි අපේ ශක්තියෙන් තමයි සංවර්ධන කටයුතු කළේ. අද අපි සතුටු වෙන්න ඕන. දේශපාලන පරමාර්ථ මොන පැත්තේ වුණත්, ආණ්ඩුවක් හැටියට කුඩම්මගෙ සැලකිලි දැන් නැහැ. හදවතට එකඟව අපි කතා කරන්න ඕන. අප ප්‍රාදේශීය සභාවේ 1992 ඉඳලා අවුරුදු 28 ක් වෙනකම් අපේ සිහිනයක් තිබුණා. ඒ සිහිනය සැබෑ කර ගන්න කාටවත් බැරි වුණා. ආණ්ඩු පැත්තෙ බලය තිබුණා. සභාව ආණ්ඩු පැත්තෙ තිබුණා. අපේ යුතුකම ඉෂ්ට කරන්න බැරි වුණා. ඒ සංවර්ධන යුගයට යන්න බැරි වුණා. මේ මොහොත වන විට අපි සමස්තයක් හැටියට කෝටි දෙකක් මේ සභාවට නිකන් දීල තියෙනවා. ඒ නිසා සභාපතිතුමා ඇතුළු මුළු කණ්ඩායමත්, මුළු නාගොඩ ප්‍රාදේශීය සභාවේ සියලුම ජනතාවත් සතුටු වෙන්න ඕන. මෙච්චර කල් අපට ආදාහන කටයුතු සඳහා යන්න සිද්ධ වුණේ බද්දේගමට හරි වෙනත් ප්‍රදේශයක ආදාහනාගාරයකට. මේ දෙසැම්බර් මාසේ 31 වෙනිදා වෙනකොට මෙම ආදාහනාගාරයේ වැඩ අවසන් කරන්න ඕන කියන එක සභාපතිතුමා දන්නවා. මේ මොහොත වන විට කෝටි දෙකක් ලබා දීලා තියෙනවා. මෙහිදී දේශපාලන නායකත්වය, ආණ්ඩුවේද කියලා බැලුවේ නැහැ. ආධාර මුදලක් දෙනවා කිව්වට පස්සේ, තමුන්නාන්සේලා වගේ කුහක සිතින් බැලුවෙ නැහැ. අපිට කවුරු හරි යමක් දුන්නොත්, හරි දේ, හොඳ දේ හොඳයි කියන්න ඕන. නරක දේ නරකයි කියන්න ඕන. එහෙනම් අපි

හොඳ දේට සියලු දෙනාම අත් උස්සන්න. ඒක කුහක සිතින් බාර ගන්න එපා. මේ මොන ආණ්ඩුවෙන් දුන්නත් අද සංවර්ධනය වෙන්නේ අපේ ගම, අපි බලප්‍රදේශය. දැනට කෝටි සියයකට වැඩිය සංවර්ධන අරමුදල් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට ඇවිල්ලා තියෙනවා. කවුරු ධර්ම දේශනා කලත් අහන්නෙ අපේ දරුවෝ නම්, යහමග යන්නේ අපේ දරුවෝ නම්, ඒ අපි ඒ ගැන සතුටු වෙන්න ඕන.

ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදුවෙද්දී සියලු දෙනාම සතුටු වෙන්න ඕන. අද මේ සංවර්ධන වැඩ කොටස් නොකෙරුණා නම් තමුන්නාන්සේලා, අපි කිසි කෙනෙකුට පාරෙ බැහැලා යන්න හම්බ වෙන්නේ නැහැ. මේ පාරවල් වල යන්න බැහැ කියලා මිනිස්සු දොස් කියාවි. ප්‍රාදේශීය සභාව තුළ ඉතිහාසය වෙනස් කළා. ඒ විතරක් නෙවෙයි අද කුඩා පාරවල්, මේ මොහොත වන විටත් කාපට් දාලා, හොඳ තත්ත්වයෙන්, පළවෙනි ශ්‍රේණියේ පාරවල් තත්ත්වයට පත් වෙනවා. ඉතින් ඒවා ගැන සාකච්ඡා කරන කොට, විපක්ෂයට විතරක් නෙවෙයි ආණ්ඩු පක්ෂයේ සභාපතිවරයාට ආරාධනා කෙරුවා. අපි දෙගොල්ලම එකට සාකච්ඡා කරලා තමයි මේ හොඳ දේ තෝරා ගත්තේ. සමහර මන්ත්‍රීවරුන්ට අත්දැකීම් නැහැ. මේකේ ඉතිහාසය දැනගෙන ඉන්න ඕන. ඒ අත්දැකීම් තුළ තමයි අපි මේ කතා කරන්නේ. ඒ නිසා අපි සියලු දෙනාම සතුටු වෙන යුගයක් තමයි මේ ඇවිල්ල තියෙන්නෙ. මම ඒ පිළිබඳව මීට වැඩිය කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.

ඒ වගේම මෙතුමාම දැන් විරුද්ධ වුණා. පළවෙනිදා ලෝක ළමා දිනේ සමරන අවස්ථාවට. නමුත් මම කියනවා මම නං යෝජනාවට පක්ෂයි කියලා. මොකද ළමා මනසට අවශ්‍ය දේ අපි තේරුම් ගන්න ඕන. ''අ''යන්න "ආ"යන්න විතරක් නෙවෙයි. අනිත් දේවල් දරුවන්ට විඳින්න දෙන්න ඕන. උදේ ඉඳලා ළමයින්ට උගන්වනවා. උදේ නැගිට්ටවලා,පාසල් එක්කගෙන ගිහිල්ලා, එක හමාර වෙද්දි බත් පැකට් එකත් බලෙන් කවලා, හැන්දෑවෙ 8.30 ට විතර තමයි දරුවෝ ගෙදර එක්කගෙන යන්නේ. මේ වැඩිහිටි මන්ත්‍රීවරු අපි කල්පනා කරන්නේ, අපේ පුංචි කාලේ කොච්චර සුන්දරද කියලා. දැන් දරුවොත් ඒවට කැමතියි. එහෙම නම් අධ්‍යාපනයෙන් බැහැර වෙලා, දවසක් හරි ඒ දරුවන්ට විනෝදය දෙන්න ඕන. උත්පත්තියේ ඉඳලා මරණය දක්වා කියලා කියනවනම්, මේක අපේ වගකීමක්. ළමා වයසේදී මනස හරියාකාරව පිරිසිදු කළොත්, හොඳ පුරවැසියෙක් රටට බිහි කරන්න අවස්ථාව ලැබේවි. ඒක තමයි කෙරෙන්න ඕන. සල්ලි මත්තෙම බලන්න එපා. කරන්න අමාරු වෙන්න පුළුවන්. නමුත් ඒ ශක්තිය අපි ලබාගත යුතුයි. ඒ නිසා මේ යෝජනාවට මම පක්ෂ වෙනවා කියලා තමයි මම කියන්නේ.

ඒ වගේම මෙතනදි ඔය මුදල් ගැන කතා කළා. වර්තමාන අග්‍රාමාත්‍යවරයාට අපිත් අපේ ගෞරවය පුද කරන්න ඕන. ප්‍රාදේශීය සභාවේ බිම් මට්ටමේ මන්ත්‍රීවරුන්ට මේ වෙනකොට ලක්ෂ 10ක මුදලක් දීලා තියෙනවා. නෙරංජලී මන්ත්‍රීතුමිය දන්නේ ලක්ෂ 5යි. ඊටත් කලින් තව ලක්ෂ 5ක් ලබා දුන්නා. නැවතත් අමාත්‍යවරයා ලක්ෂ 6ක මුදලක් ලබා දුන්නා. සති දෙකක් විතර යනකොට තවත් යෝජනාවක් ඉල්ලලා එවලා තියෙනවා. ඒකත් තමුන්නාන්සේලට ලැබෙයි. ඒක නිසා මේ සංවර්ධන වැඩ ගැන අපි සියලු දෙනාම සතුටු වෙන්න ඕන. අපේ පරමාර්ථය හොඳනම්, අපිට හොඳ ගමනක් යන්න පුළුවන්. වීරසිංහ කම්පැනි විසින් ඌරල යාඩ් එකක් ගහනවා. තලගහ ඉඳලා නෙලුවට. කෝටි හැට එක් දාහයි. ඉතින් මෙවැනි සංවර්ධන කටයුතු කෙරෙනවා. මේවා කෙරෙන්නේ අනාගත පරපුර වෙනුවෙන්. ඒ වගේම ළඟම පාසල හොඳම පාසල වැඩසටහන් කටයුතු සිදු කළා. ඒ වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිලි ඉදි වෙනවා. රට වටේම එවැනි ගොඩනැගිලි ඉදිවෙනවා. අද ගමට නිලසෙවන ඇවිල්ලා තියෙනවා. ඒ නිසා ග්‍රාම නිලධාරීතුමා, සමෘද්ධි සංවර්ධන නිලධාරි, එකම වහලක් යටට ගිහිල්ලා ඒ සියලු සේවාවන් ලබා ගන්න පුලුවන් අවස්ථාව ලබා දීලා තියෙනවා. රාජ්‍ය සේවකයන්ට වැටුප් වැඩි කළා. විශ්‍රාමිකයන්ට විශ්‍රාම වැටුප් වැඩිකරලා, අද ඉතිහාසය සම්පූර්ණයෙන්ම වෙනස් කරලා තියෙනවා. තවම තමුන්නාන්සේලගෙ රාජපක්ෂ ආණ්ඩුවේ ගානට පෙට්‍රල් ටික, ඩීසල් ටික ආවෙ නැහැ. අවශ්‍ය වෙලාවට තුරුම්පු ටික දෙන්නම්. දැන් කියන්නෙ නැහැ. තමුන්නාන්සේලාගේ නායකයා සුගතදාස ස්ටේඩියම් එකේදි, රටේ නීතිය නවනවයි කියලා කිව්වා.

එදා ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුවරිය ශිරාණි බණ්ඩාරනායක මැතිනිය, තීන්දුව තමන්ගෙ අවශ්‍යතාවයන්ට දුන්නෙ නැති වුනහම, දෙකට තුනට නවලා අධිකරණය කුඩුපට්ටම් කෙරුවයි කියන එක රාජපක්ෂ ආන්ඩුවේ එදා සිද්ධ වුණා. මාධ්‍යයට පාරෙ බැහැල යන්න බැරි වුණා. අහිංසක මාධ්‍යවේදීන් කිඹුල් කටට දැම්මේ. ඒවා වෙලාවට කියන්නම්. අන්න එහෙම තමයි තමුන්නාන්සේලාගේ අපේක්ෂකයගේ ගති ලක්ෂණ. නමුත් අපි පරදින්නෙ නැහැ. තමුන්නාන්සේලා ද ස්ටේඩියම් එක 5000කින් පුරවන කොට, ඌව අපි පිරෙව්වා. ඊට පස්සෙන්දා ජේවීපී එක තමුන්නාන්සේලාට කොඩිවිනයක් වුණා. අද අපටත් කොඩිවිනයක් වුණා. ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයක් විදියට කොඩිවිනයක් කියලා තමයි මම කියන්නේ. පස්දෙනෙක් තියාගෙන ත්‍රීවිල් එකත් පටවගෙන ආණ්ඩුවක් අල්ලන්න යනවා. තව මාස තුනක් ඉවසගෙන ඉන්න. ජනවාරි මාසේ වෙනකොට එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තුළ, එක්සත් ජාතික පක්ෂ ජනාධිපතිවරයෙක් පත් කරනවයි කියන එක මම නිර්භයව කියනවා. නමුත් ඒකෙන් ප්‍රාදේශීය සභාවටවත්, තමුන්නාන්සේලටවත් මේ කිසිම කෙනෙකුට අකටයුත්තක් වෙන්න මේ රජය ඉඩ තියන්නේ නැහැ. අපි පාට පක්ෂ භේද බලන්නේ නැහැ. දැන් වුණත් මේ වැඩ කරන විට අපට ගිහින් කියන්න තිබුණා. සභාපතිතුමා පොහොට්ටුවෙ, අපට ලයිට් එකක්වත් දෙන්නේ නැහැ කියලා. නමුත් අපි එහෙම කිව්වේ නැහැ. මොකද බල්බ් එකක් නිසා මේ සංවර්ධන වැඩ වලට එන සතපහක්වත් අපි නවත්තන්න කටයුතු කරන්නේ නැහැ. ඒක තමයි අපේ කණ්ඩායමේ ප්‍රතිපත්තිය. ඒ නිසා ඉදිරි අපේ රජයකින් මේ ප්‍රදේශයේ තව තවත් සංවර්ධන වැඩ සිද්ධ වෙයි. බලාගෙන ඉන්න අමාරුවෙයි. නමුත් සභාපතිතුමා, මේ කිසි වෙලාවක කවදාවත් ඔයාලගේ නිසා මුදල් ඕන නැහැ කියලා නැහැ. අපේ රජය තුළ අපේ රජයක් තුළ 2030 වෙනකම් මේ රටේ සංවර්ධන වැඩ අවසන් කරන්නේ නැහැ. හැබැයි කනගාටුවෙන් වුණත් තව අවුරුදු තුන හතරකින් මේ ප්‍රාදේශීය සභාවෙ බලයත් අපි ගන්නවා. සභාපතිවරයා එක්ක තියෙන කෝන්තරයක් නෙවෙයි. ඒක තමයි අපේ ප්‍රතිපත්තිය. අපි යන ගමන අපි යනවා. ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන්, කුහකකමින් අපි සේවය කරන්නේ නැහැ. එහෙමනම් තමුන්නාන්සේලා දෙයියන්ගේ නාමෙන්, රටේ අහිංසක ජනතාවගේ නාමෙන්, හෙට දවසේ ඉපදෙන්න ඉන්න දරුවන්ගෙ නාමයෙන්, මේ රට ගෝඨට ගියොත් ඒකාධිපති වියරු රාජ්‍යයක් බිහිවෙනවා. ඒක නිසා අපි ඒක කෙසේ හෝ වැළැක්වීම සඳහා, එක්සත් ජාතික පක්ෂයේ ජනාධිපති වරයෙක්, අපේ සුදුස්සා සුදුසු වෙලාවට ඉදිරිපත් කරනවා කියලා තමුන්නාන්සේලාට කියමින්, ජයවේවා! කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු මන්ත්‍රී අමර ධනංජය මහතා**

ගරු සභාපතිතුමනි, පළමුවෙන්ම මම අපේ සභාවේ ගැටලු කීපයක් ගැන කතා කරන්න ඕන. මේ වෙනකොට උඩුගම කොටස වගේම අනෙක් සියළුම ප්‍රදේශවල ලයිට් ප්‍රශ්නය සභාව විසින් විසඳලා තියෙනවා. ඒ පිළිබඳව මම පළමුවෙන්ම මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඒ වගේම ගෝනදෙනිය 72 මාර්ගය වල් ඉවත් කර, පිරිසිදු කිරීම සඳහා සඳහා මට මාර්ග කම්කරුවන් ලබාදීම සම්බන්ධයෙනුත් මගේ ස්තුතිය පුද කරනවා. ඒ වගේම ගරු සභාපතිතුමනි, අපි හැමදාම සේවකයන්ගේ දොස් දැක්කා. සේවකයන් විවේචනය කලා. නමුත් සේවකයින්ට චෝදනා කිරීමවත්, සේවකයන්ට දඬුවම් කිරීමවත්, සේවකයන්ට බලපෑම් කිරීමවත් නෙවෙයි. අපි කරන්න ඕන. සේවකයන් සමග එකතුවෙලා සහයෝගයෙන් වැඩ කටයුතු කරන තැනට පත් කරන ක්‍රමවේදයක් අපි සකස් කරන්න ඕන. විශේෂයෙන්ම මම පහුගිය දවසක උඩුගම උපකාර්යාලයට යන විට, වෙන කිසිම සේවකයෙක් එතන හිටිය නැහැ. නමුත් ඇඹිලි මැෂින් එකේ ඇඹිල්ල තියන්න එක් සේවකයෙක් විතරක් ප.ව. 4.45 වෙනකන් දැඩි කනස්සල්ලකින් එතැන රැඳී ඉන්නවා. මම කිව්වා නාගොඩ ප්‍රධාන කාර්යාලයේ ඇඹිල්ල තියන්න කියලා. මට නාගොඩ ඇඹිල්ල තියන්න දෙන්නේ නැහැ කියලා කිව්වා. උඩුගම ඉන්න අයට ගැටළුවක් නැහැ. ගෙවල්වල ගිහිල්ලා, ඇවිල්ලා හතරහමාරට ඇඹිල්ල තියනවා. ඒ

වගේම ඇඹිල්ල තියන්න එන වෙලාවක හරි සේවකයට කොහෙදි හරි අනතුරක් සිද්ද වුනොත් සභාව වගකියන්න ඕන. මේ සේවකයින්ට වෙන අසාධාරණය නිසා, මම සානුකම්පිතව ඉල්ලීමක් කරනවා. ඒ සේවකයටත් නාගොඩ ප්‍රධාන කාර්යාලයේ ඇඹිල්ල තියන්න අවස්ථාව ලබා දෙන්න කියලා. මොකද කුණු අදිනවා කියන එක, එසේ මෙසේ රාජකාරියක් නෙවෙයි. ඉතාම අප්‍රසන්න පීඩාවට පත්වන දෙයක්. ඉතින් ඒ ප්‍රදේශයේ දවසේ වැඩ ඉවර කළා නම්, ඒ සේවකයාට නාගොඩ හරි, මාපලගම හරි, උඩුගම හරි ඇඹිල්ල තියන්න අවස්ථාව ලබාදෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, පොලේ කුණු ඉවත් කිරීම පිළිබඳව නීත්‍යානුකූලව බැලුවොත්, අපට මාර්ග කම්කරුවන් යොදා ගෙන, ඒ කාර්යය කරන්න බැහැ. මොකද ඒක ඒ අයට කරන අසාධාරණයක්. පොළේ කුණු ඉවත් කිරීම සෞඛ්‍ය කම්කරුවන්ගේ කාර්යයක්. ඔබතුමා ආයතන ප්‍රධානියා හැටියට, පියෙක් වගේ, සැර නොවී, සහයෝගයෙන් උපක්‍රමශීලීව සේවකයන්ගේ සහයෝගය ලබා ගමු කියලා මම ඉල්ලා සිටිනවා. මම උදාහරණයක් වශයෙන් කිව්වොත්, මගේ තාත්තා මට දෙයක් හරි කිව්වොත් මේ දේ කරන්නේ නැහැ නමුත් රුපියල් සීයක් දීල ෆෝන් එකට ඊට වඩා එකක් දාගෙන ඒ වැඩේ කරන්න කිව්වොත් නේ වගේ උපක්‍රමශීලී වෙන්න ඕන

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ සභාවේ සේවකයෙක් ඔට්ටුවක් අල්ලලා තියෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති අපේක්ෂකයා වෙන්නේ නැහැ කියලා. සභාවෙ සේවකයෙක් එක්කම තමයි ඔට්ටු අල්ලලා තියෙන්නේ. ඒ ඔට්ටු අල්ලලා බයිසිකලයක් පැරදිලා තියෙනවා. මම වෙච්චි සිදුවුන සිදුවීම සියල්ල දන්නවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, වනමල් මන්ත්‍රීතුමා මතක් කළා. ගෝනදෙනිය පිට්ටනිය සම්බන්ධව, ගෝණදෙණිය පිට්ටනිය කියන්නේ, රජයෙන් මහජනතාවගේ මුදල් වියදම් කරලා ඉදිකරපු දැවැන්ත ගොඩනැගිල්ලක්. ගෝණදෙනිය වී ගබඩාව සහ ඉඩම, හැමදාම රට විකුණන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේක ඇප්තොප්වත්ත අයිතිකාරයට විකුනනවා. ඒ ඇප්තොප් එකේ අයිතිකාරයගෙන් රුපියල් ලක්ෂ දහයක වැනි සුලු මුදලකට මේක ගන්නේ. එක්සත් ජාතික පක්ෂ බද්දෙගම ආසන සංවිධායකවරයා වෙලා හිටපු ආනන්ද කාරියවසම් මැතිතුමා, ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක වරයා ඒ අයගේ ආණ්ඩුව යටතේ, තමයි නඩු පවරන්නේ. මේ මැණුම් කටයුතු සිද්ධ කරලා හරියට ආවොත්, ඒ වී ගබඩාව සහ ඒ ඉඩම ඉදිරි අපේ ආණ්ඩුව යටතේ රජයට පවරා ගන්න කටයුතු කරන්න කියලා. මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ඔය නඩු කිසිම දෙයක් අදාල නැහැ. ඉඩම් පවරා ගැනීමේ බලතල සම්පූර්ණ සභාපතිවරයා සතුයි. මගේ උපරිම ශක්තිය මේ වී ගබඩාව සහ ඉඩම රජයට පවරා ගැනීම සඳහා මම යොදවනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, මට තව දෙයක් කියන්න තියෙනවා. ගෝණදෙනිය පිට්ටනියත් එක්කම ඉස්සරහ තියෙන ඉඩම, ඉඩමේ අයිතිය තිබ්බේ ග්‍රාම සංවර්ධන සමිතියට. ග්‍රාම සංවර්ධන සමිතියෙන් මේක සභාවට පවරගන්නවා. මම ආපු පළවෙනි දවසෙම මේ සම්බන්ධව තොරතුරු ඉල්ලා සිටියා. 1996 එවකට හිටපු ප්‍රාදේශීය ලේකම් විසින් ග්‍රාම සංවර්ධන සමිතියට පවරපු ලියුමත්, සභාවට පවරපු ලියුමත් තියෙනවා. ඊට පස්සේ මේකට පුද්ගලික හිමිකාරයෙක් නඩු දානවා. මේ නඩුව දිගින් දිගටම 1996 ඉඳලා ඇදෙනවා. 2002න් පස්සේ මෙ නඩු ෆයිල් එකට වෙච්චි දෙයක් නැහැ. ගරු සභාපතිතුමනි මොකද වෙලා තියෙන්නෙ කියලා, මම ඒ ගැන සොයා බැලුවා. එවිට පුද්ගලික නඩුව දාලා තියෙන්නෙ, එවකට මේකෙ හිටපු සභාපතිතුමාගේ ඥාතියෙක්. ඒ ෆයිල් එක නැහැ. අද ඒ නඩුවට සභාවේ තොරතුරු ටික ගත්තේ සණස සමිතියෙන්. ඒ නඩුවේ පළමු විත්තිකරු මගේ තාත්තා. මගේ තාත්තාගේ ඉල්ලීමට අනුව ඉඩම පවරලා තිබුණේ. මගේ පියා බලයට පත් වීමත් සමඟ නඩුව නැවත කතා කරනවා. දැන් මේ වෙද්දි පහුගිය සතියේ ඒ ඉඩම මැනුම් කටයුතු සිදු කරන්න ආවා. ඒ මැනුම් කටයුතු සිදු කරයින් පස්සේ මම ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධව උපරිම අවධානය යොමු කරලා

හැකි ඉක්මනින් ඒ ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කරන්න. ඔය සද්ගුණවත් කියලා හිතාගෙන, කියාගෙන ඉන්න අය එක්තරා දේවල් විතරයි ඉදිරිපත් කරන්නේ. ඉදිරියට ඒ සියල්ල එකිනෙක ඔප්පු කරන්න මම සූදානම්.

ඊට පස්සේ ගරු සභාපතිතුමනි, උඩලමත්ත පන්සල ගැන මට කතා කරන්න ඕන. හාමුදුරු කෙනෙකුට බණ කියන්න ඇමති කෙනෙක් ගෙන් අවසර ගන්න ඕන නැහැ. ගරු සභාපතිතුමනි ඒක මහ විහිළුවක්. ආගම කියන්නේ අපි ඕන කෙනෙකුට ඒ ගැන අදහස් ඉදිරිපත් කරන්න අයිතියක් තියෙනවා. ඒ අදහස් ඉදිරිපත් කළා කියලා, විවේචනය කලා කියලා, පන්සල වර්ජනය කරන්න දෙන එක, ඔය මහ ලොකු මහත්මා දේශපාලනය ගැන කතා කරන උදවියගේ තුච්ච දේශපාලනය කියලා මම කතා කරනවා. ඔය කියන ඇමැතිවරයා මුස්ලිම් අන්තවාදයට උඩගෙඩි දීපු හැටි, ඉදිරියේදී අපි ඔප්පු කරල පෙන්නන බවත් මේ අවස්ථාවේ මතක් කර සිටිනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, සමෘද්ධි ලිස්ට් එක ගැන කතා කරන්න ඕන. අද අදාළ මන්ත්‍රීවරයා නැහැ. සමෘද්ධිය කියන එක රාජ්‍ය ආයතනත් එක්ක දෙන එකක්. ප්‍රාදේශීය ලේකම් හරහා අමාත්‍යාංශය හරහා එන එකක්. නමුත් කියන්න කනගාටුයි. ගෝනදෙනිය සහ හගරන්වල කොට්ඨාසයේ ලිස්ට් එක අදාළ මන්ත්‍රීවරයා අමාත්‍යාංශයට ගිහිල්ලා, අතේ තමයි ගෙදරට ගේන්නෙ. මොකක්ද මේකේ තියෙන පැහැදිලි නිරවද්‍යතාවය. රස්සා තියන මිනිස්සුන්ටත්, ව්‍යාපාර තියෙන මිනිස්සුන්ටත්, වාහන තියෙන මිනිස්සුන්ට සමෘද්ධිය දීලා තියෙනවා. ඒ වගේම, ගරු සභාපතිතුමනි, 5%,4% පොලියට රජයේ ණය දෙනවා කිව්වා. සහන ණය ගත්ත එක මනුස්සයෙක්වත් නැහැ. අවුරුදු හතරක් ඉඳලා අන්තිම මොහොතේ එක ගෙදරකට යන පාරක් කොන්ක්‍රීට් කරලා තියෙනවා. මහ බැංකුව කඩල ගත්ත සල්ලි ටික පොම්ප කරලා මැතිවරණය ඉලක්ක කරගෙන බොරු ටොෆියක් දෙනවා. දැන් සුරංගනා කතා ටිකක් කිව්වා. ඊළඟ ජනාධිපති වෙන විදිය, ගරු සභාපතිතුමනි, ලංකාවේ ලියාපදිංචි ඡන්ද ලක්ෂ 160 යි. ඉන් 20% ක් ඡන්ද පොළට යන්නෙ නැහැ. ඒ කියන්නේ ලක්ෂ 128යි. ඒ ලක්ෂ 128 න් 50.1% ක් ගන්න කෙනා තමයි දිනන්නෙ. ඒ කියන්නේ ලක්ෂ 64 ක් ගන්න කෙනා තමයි දිනන්නෙ. පසුගිය පළාත් පාලන මැතිවරණය ගත්තම, එජාපය දිගම්බරන්, බදුර්දීන්, හකීම්, මනෝ ගනේෂන්, පාඨලී චම්පික, රතන හාමුදුරුවෝ ආදී මේ සියලු දෙනා එක්ව එක්සත් ජාතික පෙරමුණෙන් ඡන්දෙ ඉල්ලුවා. ලක්ෂ 36 යි. තව ලක්ෂ 28 ක ඔළුගෙඩි මේගොල්ලො හොයන්න ඕන. අපි ලක්ෂ පනස් එකක් ගන්නවා. අපට අවශ්‍ය ලක්ෂ 13යි. ජනතා විමුක්ති පෙරමුණේන් ලක්ෂ 06 හෝ 07 ක් ගන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ලක්ෂ දාහතරක් තියෙනවා. අලුත් ඡන්ද ලක්ෂ 12ක් තියෙනවා. ක්‍රිස්තියානි ඡන්ද ලක්ෂ පහක් තියෙනවා. ලක්ෂ 13 කියන්නේ අපිට ගැටලුවක් නැහැ. ගෝඨාභය රාජපක්ෂ මහතා නෙවෙයි, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ගෙදර වැඩ කරන කෙනෙක් දැම්මත් ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩු විරෝධයක් වෙද්දි අපිට දිනන්න පුළුවන්. ආණ්ඩු විරෝධී නිසා ඔබතුමාලා සිහින මවාගෙන ඉන්න එකේ තේරුමක් නැහැ කියලා කියනවා. ගරු මන්ත්‍රීතුමා, තව දින 100යි තියෙන්නේ. ඒ දින 100න් අලුත් රටක්, අලුත් ජනාධිපතිවරයෙක් රටට ගමට අපට ජනතාවට ආදරය කරන මේ රට සුරක්ෂිත කරන සංවර්ධනය කරන මහත්මා දේශපාලනය කරන දැවැන්ත එඩිතර කොන්ද පණ තියෙන නායකයෙක්, මම හිතන්නේ ඔබතුමන්ලාගේ සම්මේලනයේ දී රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ඉල්ලලා තියෙන්නෙ. එහෙම නායකයෙක් එක්සත් ජාතික පක්ෂයේ නැහැ කියලා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෝම තමයි කියන්නේ. ඒ වගේම ඔබතුමාලට ගෝඨාභය රාජපක්ෂ කියන චරිතය මතක් කරනවා නම්, කොළඹ මහ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරු මාධ්‍ය සාකච්ඡාවක් තියලා, ගෝඨාභය රාජපක්ෂ කියන්නේ කවුද කියලා පැහැදිලි කළා. ඔබතුමන්ලාට අවශ්‍ය නම් මගේ කතාව රිපීට් කරලා අහන්න. අවසාන වශයෙන් තව සභාවාර හතරකදී අපේ ජනාධිපතිවරයෙක් අපේ ආණ්ඩුවක් යටතේ මේ රට සුරක්ෂිත කරන බවට ප්‍රකාශ කරමින්, මගේ කතාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මන්ත්‍රී නන්දන නිශාන්ත මහතා**

ගරු සභාපතිතුමා ඇතුළු සියළු දෙනාගෙන් අවසරයි. මම අද කතා කරන්න නෙමේ හිටියේ. ඔබ වෛරයෙන්, ද්වේශ සහගත විදිහට කතා කරනවා ඇහුනම කතා කරන්න හිතුණා. වෙන මුකුත් හින්දා නෙවෙයි. ධනංජය මන්ත්‍රීතුමාට අපි උත්තර දීලා වැඩකුත් නැහැ. නමුත් ගරු මන්ත්‍රීතුමා, මෙතන කිසිම මන්ත්‍රීවරයෙක්, මේ ඉන්නෙ රාජ්‍ය නිලධාරියෙක්වත්, මේ සභාවේ වැඩ කරන අයවත් අයථා ලෙස මුදල් ගනුදෙනු කරලා, වෙනත් වැරදි ක්‍රමයකට සල්ලි හම්බ කරන උදවිය කියලා විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා මොන ආණ්ඩුව ආවත්, මේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්නයක් නැහැ. මම වැරදි කරනවා නම්, ආණ්ඩුවෙන් සදාචාරාත්මක විරෝධී විදියට හම්බ කර ගන්නවා නම්, අපි වැරදියි. රණ්ඩු වෙලා ගහමරාගන්න හදන්නේ රට හදන්න නම් ප්‍රශ්නයක් නැහැ. සහබන්දු මහත්මයා, වසන්ත කුමාරගේ මහත්තයා, බන්ධුල මන්ත්‍රීතුමා මේ කිසි කෙනෙක් එහෙම වැඩ කරන්නේ නැහැ. අපේ සල්ලි වලින් තමයි ජීවත් වෙන්නේ. ඒ නිසා අපි කාටත්, පොළොවේ පයගහලා බය නැතුව ඉන්න පුළුවන්. හැබැයි ඔබ මේ කියන විදිහට මේ ඉන්න අනිත් කිසිකෙනෙකුට ජීවත්වෙන බැරි විදිහට ගෝඨාභය මහත්තයා ආවම දෙන්නම් පාර කියලා වගේ තමයි කතා කරන්නේ. කොයි කවුරු හරි ඇවිල්ලා, රට හදනවනම්, මිනිස්සුන්ට හොඳයි. හදන්න පුලුවන්නම් අපි කැමතියි. අපට බය තියෙන්නේ අහිංසක මිනිස්සු මරයි කියලා. අපි ඒවා ගැන කතා කරන්නේ නැහැ. අපට වැඩක් නැහැ. අපි බලමු රට හදන හැටි. රට හැදෙනවා නම් ඔබට, මට හැම දෙනාටම එකයි. නමුත් ඔබ අද ප්‍රාදේශීය සභාවට පත් කරලා එවපු මිනිස්සු ගැන කතා කරන්නේ නැතුව, ගෝඨාභය ගැන කතා කරනවා. ඔබතුමන්ලා ඡන්දෙ දීලා මෙහේට එව්වේ, ගමට වැඩක් කරයි කියලා. ඔබතුමාලා ගිහිල්ලා බොරු පොරොන්දු දුන්නා. ඒව ගැන වචනයක්වත් කතා කරන්නේ නැහැ. යූඇන්පියට චෝදනා කරමින්, මේ මන්ත්‍රීවරුන්ට ඇඟිල්ල දික් කරමින්, නඩු ෆයිල් නැති කරමින්, මම ඔබතුමාට එක දෙයක් කියනවා. මම දන්න ටික කිව්වොත්, ඔබතුමාට කතා කරගන්න බැහැ. ඒ ගැන මේ උප සභාපතිතුමාගෙන්, අපේ සභාපතිතුමාගෙන් අහගන්න. ඒ ගැන මම කියන්නෙ නැහැ. මොකද අපට ආත්ම ගරුත්වයක් තියෙන නිසා. ඒ නිසා අනිත් අයට ඇඟිල්ල දික් කරන්න එපා. චෝදනා කරන්න එපා. මම ගරු සභාපතිතුමාට කියන්නේ ඔබේ මන්ත්‍රීවරු පාලනය කර ගන්න. ඇමතිවරුන්ට ඇඟිල්ල දික්කරලා, තමන්ට රස්සාව දීපු මිනිහා විවේචනය කරනවා. මෙතන ඇමතිවරු විවේචනය කරන තැනක් බවට පත් කරගන්න එපා. වජිර අබේවර්ධන ඇමතිතුමා ගැන නේද කියන්නේ. මොන මුස්ලිම් මිනිහටද දුන්නේ කියලා කියන්න. අපි දන්නවා හාමුදුරුවරු හැසිරෙන විදිහ අපට ප්‍රශ්නයක් නැහැ. ඒ එයාලගේ අයිතිය. නමුත් මේ සභාවේ වරප්‍රසාද පාවිච්චි කරලා, සභා වාර්තාවලට මේ ජරා විදිහට මිනිස්සුන්ට කතා කරලා යවන එක නවත්තන්න. ඔබතුමාලට පුළුවන් නම්, මුස්ලිම් ප්‍රජාවට මොනවා හරි ත්‍රස්තවාදයට උදව් වෙන විදිහේ මොනාහරි වැඩක් කරලා තියෙනවනම්, කතා කරලා කියන්න. ඒ වගේම මුස්ලිම් කඩයක් වහපු වෙලාවේ උදව් කරයි කියලා ප්‍රකාශයක් තිබුණා. එකේ මුස්ලිම් කඬේ වහන PHI චමින්ද ඉන්දික මහත්තයා ඇත්ත කතාව දන්නවා. ඔහු යටලමත්තෙ කෙනෙක්. එතුමාගෙන් හරි විස්තරය දැන ගන්න පුළුවන්. ඔබතුමාලගේ ප්‍රශ්න වලට උත්තර දෙන්න ගියොත්, අපි ඊට වැඩිය පහළට වැටෙනවා. ඒ නිසා මම නැවතත් කියන්නේ නොදන්න දේ සුසන්ත මන්ත්‍රීතුමාගෙනුයි, අජිත් එඩ්රිආරච්චි හිටපු සභාපතිතුමාගෙනුයි අහගන්න කියන එකත් මතක් කරමින්, ඔබ සියලු දෙනාම අපහසුතාවයකට පත්වුණා නම්, අනිත් මන්ත්‍රීවරු සමාවෙන්න කියලා ඉල්ලා සිටිමින්, ඔබ සියලු දෙනාටම සුභ දවසක්.

**ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, සභාවේ කටයුතු කල්වේලා ගිහිල්ලා තියෙන වෙලාවේ, තවත් ටිකක් වෙලා ගියත් මොකද කියල හිතෙන නිසා මමත් කතා කරන්න හිතුවා. පළමුවෙන්ම කියන්න ඕන. මට මතකයි. කරපටුව වෙල්ල කියන මාර්ගයට නිශාන්ත මුතුහෙට්ටිගම ඇමතිතුමා විසින් ලක්ෂ 10ක මුදලක් පාස්වුනා කියලා මේකේ කතිකාවකට ආවා. ඊට පස්සේ මම හිතන්නේ ඒ ගැන සභාවෙ

තාක්ෂණ නිලධාරීන් ගිහිල්ලා, ඇස්තමේන්තුවක් සකස් කළා. ඒ ගැන මම හරියටම දන්නෙ නැහැ. එහෙම නැත්නම් මෙතනින් යෝජනාවක් හැටියට ආවා. අපි ඒක සම්මත කළා. ඒකට මොකක්ද වුනේ කියලා මම දන්නේ නැහැ. ඒ පිළිබඳව ඔබතුමාගෙන් දැනුවත් වෙන්න ඕන. ඊට පස්සේ නිශාන්ත මහතා මට පෞද්ගලිකව කතා කරල කිව්වා. පහුගිය දවසක පොඩි ප්‍රශ්නෙකුත් ආවා. වෙන කුඹුරු පාර්ශ්වයක් විසින් වේල්ලක් ගොඩ කලා කියලා ඒකට විරුද්ධව ක්‍රියා කළා. ඊට පස්සේ අපි ගොවිජන සේවා මධ්‍යස්ථානයේ මැදිහත්වීම මත, දෙපාර්ශ්වයම සම්බන්ධ කරලා, යම්කිසි එකඟතාවයකට ඇවිල්ලා, දැනට පස් ටිකක් උඩට දාලා, නඩු මාර්ගයකට නොගිහිල්ලා, විසඳාගැනීමට හැකියාව ලැබුණා. එතුමාගේ ඉල්ලීමක් තිබුණා ඒතුමගේ පෞද්ගලික මුදලින් මේ වේල්ල ගොඩ කරන්න. ඒ පිළිබඳව ඇස්තමේන්තුවක් හදලා එතුමට ඉදිරිපත් කරන්න කියලා කිව්වා. නිශාන්ත මුතුහෙට්ටිගම මැතිතුමා යොදවපු මුදල් වලට මොකක්ද වුනේ කියලා තමයි මම ඇහුවේ. ඒ පිළිබඳව ඉදිරි වැඩකටයුතු කරන්න, එතුමා කොන්ක්‍රීට් කිරීම සඳහා අවශ්‍ය වන ඇස්තමේන්තුවක් හදලා ඉල්ලීමක් කළා. ඒ ගැන කතා කරන්න යොමු වුණේ, අපේ ප්‍රදේශයේ, අපේ කොට්ඨාශයේ මන්ත්‍රීතුමා කිව්වා ප්‍රතිපාදන ලබා දීල ඇලක් හාරනවා කියලා. මම හිතන්නේ එතුමා ඒ ගැන දැනගත්තේ ඒ ඇළ හාරලා ගොඩක් ඉවර වුනාට පස්සේ. ඇත්තටම ඒකට මුදල් පාස් කරල අවුරුදු ගානක් වුණා. මමත් එක්ක තිබුණ පුද්ගලික අමනාපයකට ආරියතිලක මහත්තයා තමයි නැවත මුදල් ගත්තේ. නමුත් එම මුදල නැවත එම ඇස්තමේන්තුවට ක්‍රියාත්මක කරලා, දකුණු පලාත් වාරිමාර්ග තාක්ෂණ නිලධාරි අබේවර්ධන මහත්මයා එතුමාගේ මැදිහත්වීම තුළ, ඒ මැදිහත්වීම ලබාගන්න මට වාසනාව ලැබුණේ. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංවර්ධන කමිටුවට යන්න අවස්ථාව ලැබුණ නිසයි. සංවර්ධන කමිටුවේදි මම එතුමාගෙන් ඇහුවා. ඔබතුමාලා මේක මාස ගානක් ,වාර හතරක් මැනලා තිබුණා. මගේ අතින් පෞද්ගලික මුදල් වියදම් කරලා ඒ වැඩ කරපු සේවකයන්ට කෑම ගෙනත් දුන්නා. මම ඇහුවා ඔබතුමා මේකට ගත්ත action එක මොකක්ද? දැන් මේකෙ ප්‍රතිඵලය මොකක්ද කියලා? ඒක හදලා දෙන්න ඔබතුමාට මුදල් යොමු කරන්න උත්සාහ ගන්නවා කියලා එතුමා කිව්වා. අන්න එකේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි. අද දවසේ කුඹුරු අක්කර 50ක් විතර පුරන් බවට පත්වෙච්ච ඒ ප්‍රදේශයේ කුඹුරු කිරීමට සක්‍රීය දායකත්වය ලබාගන්න හැකිවුනේ. ඒ නිසා ඔබතුමා මොන ක්‍රමවේදයකින් හිතලා කිව්වද මම දන්නෙ නැහැ. ඔබතුමා ගෙයි මගෙයි තියන ගැටලුවකට නෙවෙයි. මං ඒක ඉදිරිපත් කලේ. ඔබතුමාගෙ කතාව ඒකට ඇඳපු නිසා තමයි කතා කලේ. ඊළඟට සිහිපත් කරන්න ඕන. ඒ ඇළට මුදල් යොදවන්න ඔබතුමාලා මැදිහත් වුණේ නැහැ කියලා.

ඒ වගේම මීට පෙරත්, ගරු සභාපතිතුමනි, එක් මන්ත්‍රීවරයෙකුට දෙන කාලය වෙන් කරන්න කියලා ඉල්ලීමක් කළා. ඒක ඔබතුමාට ඇහුනෙ නැද්ද මම දන්නේ නැහැ. ඒ මන්ත්‍රීවරයාගේ කාලය මදිනම් තමන්ගේ සහෝදර මන්ත්‍රීවරයකුගේ කාලය ඉල්ලගෙන කතා කරන්න පුළුවන් ක්‍රමවේදයක් හදනවනම්, වැදගත්. අපිට දවසම නෙවෙයි එළිවෙනකම් මෙතන හිටියත් වැදගත් වන දෙයක් වෙනවා නම් කමක් නැහැ. අර ආත්තම්මා අදත් ඇවිල්ලා, දාහතර වෙනි පාරට නෙවෙයි. පහළොස් වෙනි වතාවටත් කියලා පත්තරේ වැටෙනකොට, ඒවට ක්‍රියාත්මක වෙන්න ඕන වැඩපිළිවෙළක් සකස් කරනවා නම්, අපි සතුටුයි. අපේ නන්දන මන්ත්‍රීතුමා, ගිය සභාවෙත් ප්‍රකාශ කළා. දේශපාලන පොරපිටිය මෙතනට ගේන්න එපා කියන එක. ප්‍රදේශය සංවර්ධනය කිරීමේ යෝජනා ගේන්න කියලා. මමත් ඒ කතාවට එකඟයි. නමුත් මන්ත්‍රීතුමා අපේ පැත්තට විතරක් ඇඟිල්ල දික් කරන්න එපා. ඔබතුමන්ලාගේ පැත්තක් සාධාරණීයකරණය කරන්න. ඒ නිසා අපට විතරක් චෝදනා කරන්න එපා. මම හිතන්නේ සහෝදර මන්ත්‍රීවරු සියලු දෙනා එකතුවෙලා, ඒ විදියට මේ වැඩේ කලොත් හොඳයි. මොකද අපේ ප්‍රදේශය සංවර්ධනය කරන්න ඕන යෝජනා ගෙනැල්ලා, ඒ ගැන කථා කරනවා නම් හරි සතුටුයි. මෙතනදි ඇවිල්ලා මම නම් ඔය කිසි දෙයක් ගණන් ගන්නේ නැහැ. මට නම් වැඩකුත් නැහැ. අපේ අපේක්ෂාව, මගේ බලාපොරොත්තුවක් තියෙනවා. අන්න ඒක ඉටු වුන දවසට මටත් ගම වෙනුවෙන් කරන්න පුළුවන් සේවය කරනවා. නැතුව බොරුවට කෑ ගහලා වැඩක් නැහැ. ඒ පිළිබඳව

සිහිපත් කරමින්, මගේ කතාවට සවන් දුන්, ගරු සභාපතිතුමා ඇතුළු ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ගරු මන්ත්‍රී ගයාන් මධුසංඛ මහතා**

ගරු සභාපතිතුමනි, මට ඔබතුමාගෙන් අහන්න ප්‍රශ්නයක් තියෙනවා. මලාමුරේ වැලි වළ සම්බන්ධව, ඔබතුමා වහන්න කියපු එකක් පොලිසියේ සාමාන්‍ය නිලධාරියෙකුට පුළුවන්ද? විවෘත කරල යන්න. ඊයෙ පොලීසියෙන් රාලහාමිලා දෙන්නෙක් ඇවිල්ලා ඒක අයින් කරලා වතුර බස්සන්න කියලා, කියලා තියෙනවා. ඔබතුමාගේ නියෝගෙට තමයි මම එතනට ගිහිල්ලා, ඔබතුමාට සම්බන්ධ කරලා, ඒ නියෝගෙට අනුව තමයි එදා වැහුවෙ. ආපහු දැන් අර පරන තත්වයටම ඇල බොර වෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ බලතල හෑල්ලුවට ලක් කරලා, ඒ අය ඒ දේවල් කරල තියෙන්නෙ. එතැනට ගිහිල්ලා ඒ පොලිස් නිලධාරීන් ඒක බලලා ඇවිල්ලා, මේකට පර්මිට් තියෙනවා කියලා ගමේ අයට කියලා තියෙනවා. එහෙම නම් එතන යම් ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමා, ඔබතුමා මැදිහත්වෙලා ඒකට විසඳුමක් ලබාදෙන්න ක්‍රියාමාර්ගයක් ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඊයේ රෑ 9.00 ට විතර මම එතනට ගියා ඒ වෙනකොටත් සුපුරුදු පරිදි ඒකෙ තියෙන මඩවතුර සහ අපද්‍රව්‍ය බස්සවනවා. පොලිසිය අර විදිහට ක්‍රියා කලහම මේකෙ දෙයක් කරන්න බැහැ.

අනිත් එක තමයි ගරු සභාපතිතුමා, වීදි ලාම්පු හදන්න ඉණිමගක් අනුමත වෙලා ලබා දෙනවයි කියලා තිබුණා. නමුත් ඒක තවම නැහැ. මේ වර්ෂාව දවස් වල ඒ වැඩ කරන කාර්මික නිලධාරින්ට හා සේවකයින්ට ඒ වැඩ කටයුතු කරගෙන යන්න අපහසු තත්වයක් ඇති. මේ ගැන සොයාබලා අවශ්‍ය කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාට ස්තූතියි.

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි විශේෂ යමක් ප්‍රකාශ කරන්න දෙයක් නැහැ. සභාවේ සිදු වුණ කතා ශෛලීන් පිළිබඳව ඒ කරුණු කාරණා පිළිබඳව කතා කරන්න යන්නෙත් නැහැ. හොඳම උදාහරණය අද වෙච්ච දේශපාලන කතා දිහා බැලුවම, අද උදේ පුවත්පත්වල සඳහන් වෙනවා. රටේ මීළඟ නායකත්වය, ජාතික ආරක්ෂාව මත තීන්දු වෙනවයි කියලා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල අමාත්‍යවරයෙක්, ප්‍රබල නායකයෙක් වන සරත් ෆොන්සේකා මහත්මයා ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය පිළිබඳව රටේ ජනතාව වැඩි අවධානයක් යොමුකරයි. රට සංවර්ධනය කළත්, අන්තිමට රටේ ජනතාව තීන්දු කරන්නේ අංක එකට රටේ ජාතික ආරක්ෂාව. මීට මාස කිහිපයකට කලින් මම කරපු ප්‍රකාශය මම හිතන්නේ අද මල්ඵල ගැන්විලා තියෙනවා. ඉදිරි මාස කීපයේදී මාතෘකාව ඕකම තමයි.

ඊළඟට මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එහා පැත්තෙ තියෙන අත් ටැක්ටරයටත් වෙන්නෙ විකුණන්න බැරිව, වෙන්දේසි කරන්නත් බැරිව, පරණ යකඩවලටවත් දෙන්න බැරි තත්වයකට පත් වෙනවා. ඒක නිසා එකේ ට්‍රේලරයෙ තියෙන උපාංග කැල්ල අයින් කරලා, ඒක ප්‍රයෝජනයට ගන්න මොකක් හරි ක්‍රමයකට, නැත්නම් වීපී පහන් හයි කරන්න හරි දෙන්න. ඒකෙ වහලක් තියෙනවා. සුක්කානමක් තියෙනවා. රියදුරු බලපත්‍ර තියෙන කාර්මික ශිල්පියෙක් ඉන්නේ. ඒ නිසා ඒක නඩත්තු කරලා, අලුත්වැඩියා කරලා, පරිහරණයට ගන්න කියලා, ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වගේම පසුගිය කාලේ වෙන්දේසි කරන්න උත්සහ කරපු ජේ.සී.බී. යන්ත්‍රය ඒ වගේම පරණ යකඩ වලට විකුණන්න හදපු ට්‍රැක්ටර් සහ බවුසරය පිළිබඳ අවසාන තීන්දුවක් නිලධාරීන්ගෙන් විමසලා උපදෙස් අරගෙන ගන්න නැත්නම් එකටත් වෙන්නේ පරණ යකඩ වලට දෙන්න බැරි තත්ත්වයට පත්වෙලා තියෙනවා ඒ නිසා ඒ පිළිබඳ තීන්දු තීරණ ඉක්මනින් ලබාගන්න කියලා මා මේ අවස්ථාවේදී ඔබතුමාට පත් කරනවා සිහිපත් කරනවා

ඒ වගේම විශේෂයෙන් අපි ආදායම් උත්පාදන ක්‍රමයක් වශයෙන්, මේ වන විට ප්‍රදේශයේ නිවාස ඉදිකිරීමේදි, අපෙන් බලපත්‍ර ලබා ගන්න ඕන. ඕනම ප්‍රදේශයකදී වුවත් නිවසක් ඉදි කරනවා නම්, අපෙන් අවසරය ගන්න ඕන. ඒ නිසා අපිට මේකට මැදිහත් වෙන්න පුලුවන්නම්, නීත්‍යානුකූලව මැදිහත්වීමක් කරලා, ජනතාව දැනුවත් කරලා, ඉදිකිරීම් කටයුතු වලදී යම් මුදලක් අයකර ගන්න, අපෙන් අවසර ගන්න. Plan එකක් අනුමත කර ගන්න එන අයගෙන් ඒවා විධිමත්ව කරගෙන යන්න කටයුතු කරන්න කියලා ඔබතුමා ගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වගේම විශේෂයෙන් මම දකින දෙයක් තමයි. මේ ගරු මන්ත්‍රීතුමාලත් අනුමත කරයි. මේ ප්‍රදේශයේ වගේම බැහැර මිනිසුන්ගෙනුත් යම් යම් යන්ත්‍ර සූත්‍ර විශේෂයෙන්ම J.C.B. යන්ත්‍ර, බැකෝ යන්ත්‍ර, වැනි පස් කපන යන්ත්‍ර අපේ ප්‍රදේශවලට ඇවිල්ලා කටයුතු කරනවා. ඒ සියලුම යන්ත්‍රෝපකරණ පරිහරණය කරන රියදුරු මහත්වරු පරිසර හිතකාමී විදිහට, ප්‍රදේශයේ ජනතාවට බාධාවක් නොවන ආකාරයට, ප්‍රදේශයේ මාර්ග වලට බාධාවක් නොවන ආකාරයට, කිසිකෙනෙක් කටයුතු කරන්නේ නැහැ. හොරගහකන්ද පාර කපන්නේ අපේ පදිකයන්ට යන්න බැරිවෙන්න. ගෙපල් වලින් වතුර ටික පාරට වැටෙන්න තමයි ගෙපල කපන්නේ. තමන්ගෙ ගෙපලක් කපනවා නම්, තමන්ගෙ නිවසක් ඉදි කරනවා නම්, නිවසේ අපද්‍රව්‍ය, ඒ වගේම නිවසේ පරිහරණය කරන ජලය තමන්ගේ ඉඩමේම යොදන්න ඕන. නමුත් සියලුම පාරවල් සහ ගෙපල් කපන කට්ටිය ඔක්කොම වතුර පාරට යොමු වන ආකාරයට තමයි සකස් කරන්නේ. ඒ නිසා ඒ පිළිබඳව ඒ අදාල රියදුරු මහත්වරු දැනුවත් කරන්න. බරවමුල්ල පාරට වුනෙත් ඒකයි. වත්තේ සියළු පාරවල්වල බෝක්කු දාන්නෙ නැහැ. ඔක්කොම වතුර පාරට එන්නෙ. හැම ගම්සභා පාරකම සිදුවන්නේත් ඒකයි. කෝටි ගණන් වියදම් කරලා, කාපට් දාලා, හැදුවත්, ඒ ගෙවල් වල වතුර පාරට එවන්නේ. එනිසා PHI මහත්වරු, පවුල් සෞඛ්‍ය නිලධාරීන් යොදවලා Plan එක අනුමත කරගන්න එනවනම්, අන්න ඒ කරුණු කාරණා කෙරෙහි විශේෂයෙන්ම සලකා බලන්න ඕන. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වගේම ගරු මන්ත්‍රීවරුනි, තමන්ගේ ප්‍රදේශවල එවැනි සිද්ධීන් සිදු වෙනවා නම්, වහාම ඒ ගැන දැනුම් දීමක් කරලා, ඒ අයව දැනුවත් කිරීමක් කරලා, ප්‍රාදේශීය සභාව සම්බන්ධ කරගෙන කටයුතු කරන්න කියලා සභාවෙන් ඉල්ලීමක් කරමින්, මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව**

ගරු උප සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රීතුමන්ලාගෙන්, මන්ත්‍රීතුමියන්ලාගෙන් අවසරයි. අද කාලවේලාව බොහොම ඉක්ම ගියා. අපි ගිය සැරෙත් කතා කරගත්තේ පැය දෙකකින් සභා රැස්වීම ඉවර කරන්න. නමුත් මේ මන්ත්‍රීවරුන්ම කියයි. මට කතා කරන්න දෙන්නෙ නැහැ කියලා. නීතිය කඩ කරන්නේ එයාලම තමයි. එනිසා මම අපේ ගරු මන්ත්‍රීවරුන්ට කියන්නේ, තමන්ගේ කාලවේලාව තුල නිසියාකාරව කටයුතු කරන්න කියලා. මොකද ඔය හැම ප්‍රශ්නවලටම උත්තර දෙන්න වෙන්නේ මට. පස් කතන්දරේදිත්, පස් කපනකොට මම දැනගෙන තමයි කියලා කියනවා. ඊළඟට යටලමත්තේ බරවාමුල්ල පාරෙ වයරින් කලු මහත්තයලගෙ ගෙවල් ලඟ බෝක්කුවක් වහලා කියලා කියනවා. ඒක මම දැනුවත්ව තමයි කරන්නේ කියලා කටකතා යනවා. මම ඒ අයට ඔව් කියලා උත්තර දෙනවා. වෙන කියන්න දෙයක් නැහැ. එකට තාක්ෂණ නිලධාරි මහත්මයා යැවුවා. ගරු මන්ත්‍රීවරුනි. ගරු උප සභාපතිතුමනි, අපේ නොයෙක් කරුණු කාරණා අද පැහැදිලි වුණා. මම විශේෂයෙන්ම කියන්න ඕන අපේ අඩුපාඩු තමයි නිතරම පේන්නේ. මම මේ ප්‍රාදේශීය සභාවට 2002 ආවට, සභාපති වුණේ මීට අවුරුද්දයි මාස 6 කට උඩදී. අපේ ලොකු බලාපොරොත්තුවක් තිබුණා. ආදාහනාගාරය පිළිබඳව. ඒ අවස්ථාවේදී වජිර ඇමැතිතුමාවත් ගයන්ත ඇමැතිතුමාවත් මේ ආයතන භාරව හිටියේ නැහැ. ණයක් හරි අරගෙන කටයුතු කරන්න අපි උත්සාහ ගත්තා. අපට ඉඩමක් සොයා ගන්න බැරි වුණා අපේ පෙර වාසනාවකට දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයෙන් ඒ අදාල අමාත්‍යාංශ වලට මන්ත්‍රීවරුන් දෙන්නෙක් ඇමතිකම් ලැබුවා. ඒක අපට ලොකු වාසනාවක්. එතුමන්ලා අපේ දේශපාලන මතධාරීන්

නොවුනත්, අපට ඉඩම් ලබාගැනීමේදී, එතුමන්ලා දෙන්නා ප්‍රලුවන් උපරිම සහයෝගය දී අපේ අවශ්‍යතාවය ඉටු කර දුන්නා. හිටපු සභාපතිවරු හුඟක් උත්සාහ ගත්තා, මුල්ගල් තැබීම් ආදිය කළා. නමුත් ඉටුකර ගන්න බැරි වුණා. ඒ දවස්වල නම් ලක්ෂ 60-70 කින් ආදාහනාගාරය ඉදි කරන්න තිබුණා. නමුත් දැන් ලක්ෂ 250 ක් විතර යනවා. අපි ණයක් ගන්න කටයුතු කර ගෙන යන අවස්ථාවේදී ගරු ඉඩම් ඇමති ගයන්ත කරුණාතිලක ඇමැතිතුමා හමුවී මේ පිළිබඳව දැණුම් දීමේදී එතුමා ප්‍රකාශ කළා. ඉඩමක් ලබා දෙන්නම් කියලා. අපි LRC එකත් එක්ක සම්බන්ධ වෙලා, විශේෂයෙන්ම ඒකේ අධ්‍යක්ෂ ජනරාල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කලින් හිටපු දිසාපතිතුමා වන චන්ද්‍රලාල් මැතිතුමා. වර්තමාන LRC සභාපති අපේ හිතවත් සිරිමෙවන් ඩයස් මැතිතුමා සහෝදරයකුට වගේ ඒ අවශ්‍ය කටයුතු ටික කරල දුන්නා. එහිදී දේශපාලනය බැලුවෙ නැහැ. අපට ඒ කටයුත්ත ඉතා සාර්ථක අන්දමින් ඉටුකරලා දුන්නා. වර්තමානය වන විට ඉඩම අප සතුයි. පිඹුරුපත් සකස් කරලා තියෙනවා. MBRO එකෙන් අද එනවා කියලා තිබුණා. වැස්ස නිසා එන්න බැරි වුණා. MBRO ගිහිල්ලත් ඊට පස්සේ මේ වැඩකටයුතුවලට මාසයක් විතර යනවා. ඒකට මුදල් හොයද්දි වජිර අබේවර්ධන මැතිතුමා සභාපතිවරුන් කැඳවලා අපට ලක්ෂ 200ක මුදලක් ලබා දුන්නා. නමුත් දැන් ලක්ෂ 250ක් විතර යනවා. වෙනත් විදිහකින් ඉතිරි මුදල සොයාගන්න වෙයි කියලා මම හිතන්නේ. කොහොම නමුත් මේ අවස්ථාවේ මම වජිර අබේවර්ධන ඇමතිතුමාටත්, ගයන්ත ඇමැතිතුමාටත් ගෞරවනීය ස්තුතිය පුද කරනවා. මොකද මම සභාවට ආවේ එක දේශපාලන පැත්තකින් වුනාට, සභාවෙ වැඩ කරනකොට දේශපාලන බෙද ගන්න මට බැහැ. කොහෙන්ද මුදල් ලැබෙන්නේ, අපි ඒවා අරගෙන සංවර්ධන කටයුතු කරනවා. ඒ නිසා මම දේශපාලන කෝණවලින් බලන්නෙ නැහැ. අපේ මන්ත්‍රීතුමාලා කිව්ව වගේ අපි විරෝධවාදී නැහැ. හැම සභාවකටම ඒ අවශ්‍ය පහසුකම් ලබා දීලා තිබුණා. නමුත් අපේ උඩුගම පොළ සංවර්ධනයට ලැබෙන්න තිබුණ සල්ලි මගහැරිලා තියෙනවා. නමුත් අපි ඒ මුදල් ලබාගන්න උත්සාහ කරනවා. ඒ වගේම ආදාහනාගාරය දෙසැම්බර් මාසය 31 වෙනකොට සාදා නිම කරන්න ඕන. ඒ නිසා මම දැඩි උත්සාහයක යෙදෙනවා. අනිත් වැඩ පොඩ්ඩක් පස්සට දාලා මම ආදාහනාගාරය ඉදිකිරීමේ කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කරනවා.

අපේ ගරු උප සභාපතිතුමා වෙන්දේසිය පිළිබඳව ඇහුවා, වෙන්දේසියේදී 2018.12.31 දින භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව, SPRV 5014 ට්‍රේලරය සහ වෝටර් ජල බවුසරය 2018.03.09 දින යාන්ත්‍රික ඉංජිනේරු විසින් නිකුත් කර ඇති අපහරණ වාර්තාව අනුව, 2019.06.24 දින උඩුගම උප කාර්යාල භූමියේ පැවැති වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලදී. වෙන්දේසිය සඳහා වෙන්දේසි කරුවන් හතර දෙනකු ඉදිරිපත් වූ අතර, යාන්ත්‍රික ඉංජිනේරු විසින් සිය අපහරණ වාර්තාවේ ට්‍රේලර් ජල බවුසරය සඳහා රුපියල් 45000 ක්ද, SPRV 5014 ට්‍රේලරය රුපියල් 35000 කට අවම තක්සේරුව ලබාදී තිබුණද, එම මිල ගණන් සඳහා වෙන්දේසි කරුවන් අකමැත්ත ප්‍රකාශ කරන ලදී. උක්ත වෙන්දේසිය සඳහා ඉදිරිපත් කරන ලද වාහන එදින වෙන්දේසි නොවුන බැවින්, මේ සඳහා ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග කවරේද යන්න දන්වන ලෙස, පළාත් පාලන කොමසාරිස් වෙත ලිපියක් යොමුකර දැනුම් දී ඇත. ගුරු මන්ත්‍රීවරුනි, බවුසරයයි, ට්‍රේලරයයි සේරම ඉල්ලුවෙ යකඩ වලට. රුපියල් 27000 ක් වගේ ගානකට. ඕන්නං ඒ මුදලට දෙන්න තිබුණා. නමුත් ඊට වඩා හොඳ මුදලකට දෙන්න හැකියාව තියෙනවා. ඉතින් අපි ඒ වෙලාවේ දුන්නනම් රු. 50000.00 ක් විතර මගේ සාක්කුවෙ දාගන්නත් තිබුණා. ඉතිං අපි එහෙම වැඩ කරන්නේ නැහැ. සත පහකවත් වංචා සහගතව මොනවත් කරන්නේ නැහැ. අපට වැඩ කරන්න නම් සල්ලි හොයාගන්න ඕන. ඉදිරියේදී මේ කරන ටිකත් කර ගන්න බැරි වේවි. මොකද මුදල් තත්වය බොහොම දුර්වලයි. ඒ නිසා j.c.b. යන්ත්‍රය පිළිබඳ දැන් කටයුතු කිරීමට හැකියාවක් නැහැ. යථා කාලයේදී ණයක් ගන්න පුළුවන් වුනොත් එහෙමයි. නැත්නම් නැවත වෙන්දේසි කරන්න වෙයි කියලා තමයි මම හිතන්නේ. ඒ පිළිබඳව හරියටම තීරණයක් අරගෙන නැහැ. මේක අළුත්වැඩියා කරන්න නම් ණයක් ගන්න වෙනවා.ඉතින් අපි නොහිතපු ගානකට බවුසරයයි, ට්‍රේලරයයි දෙන්න පුළුවන්.

ඒ වගේම වනමල් මන්ත්‍රීතුමා කිව්වා වගේ මාපලගම පිරිසිදු කිරීම් කටයුතු වලදී ලක්රුවන් මන්ත්‍රීතුමා කියනවා වගේ අදාල පුද්ගලයා ගැන හිතන්න ගියොත් කරන්න බැහැ. මොකද රුපියල් 17000 ක දීමනාවක් එතුමට ගෙවනවා. ඒ ගෙවලත් අපට ප්‍රයෝජනයක් නැහැ. සිරස ටීවී එකේ පවා කුණු දාලා තියෙනවා කියලා ප්‍රචාරය වුණා.

ඊළඟට පොළවල් පිළිබඳ කතා කළා. දැන් ඔබතුමන්ලා ගිහින් බලන්න තල්ගස්වල පොල කොහොමද කියලා. ඒක දැන් අපේ කම්කරුවන් යොදවලා සම්පූර්ණයෙන්ම පිරිසිදු කරල තියෙන්නෙ. අන්න ඒ වගේ හෙමින් හෙමින් තමයි කටයුතු කරන්න වෙන්නේ. මම බලාපොරොත්තු වුණා අපේ උඩුගම පොලේ සංවර්ධනය ලක්ෂ 70 අරගෙන සිදු කරන්න. නමුත් ඒ මුදල් නැවතිලා තියෙනවා. මොනම හේතුවක් නිසාද දන්නේ නැහැ.

ඊලගට ජලයෝජනා ක්‍රම වගයක් අපට ඇවිල්ලා තියෙනවා. ප්‍රාදේශීය සභාව තමයි බලධාරියා වෙන්නේ. මොකද ජලයෝජනා පිළිබඳව රැස්වීම්වලදී ප්‍රාදේශීය සභාව දන්නෙවත් නැහැ කියලා අපි කිව්වා. ඒ නිසා සභාව හරහා ක්‍රියාත්මක වෙන්න කටයුතු කරලා තියෙනවා. නාගොඩ සහ මාපලගම ප්‍රදේශවල ජල යෝජනා ක්‍රම සඳහා ප්‍රාදේශීය සභාව හරහා රුපියල් ලක්ෂ 240 ක ප්‍රතිපාදන යටතේ වැඩ කටයුතු සිදු කරනවා.

ඊළඟට පස් කැපීම පිළිබඳව කතා කරනවානම්, ඒ ඉඩම තවම අපට නීත්‍යානුකූලව පවර ගෙන නැහැ. මැනුම් නියෝග දීලා තියෙන්නේ. තවම තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් යටතේ. නමුත් අපේ භුක්තිය. පසුගිය දිනවල ග්‍රාම නිලධාරී විසින් අපට දුරකථනයෙන් දැනුම් දුන්නම, අපි පොලීසිය දැනුවත් කළා. ලොරියකුත් ඇල්លුවා. රුපියල් පනස්දාහක ද කොහෙද දඩයක් ගැහුවා. නැවත පස් කපනවා එහි අපට දුරකථනයෙන් දැනුම් දුන්නම, අපි පොලිසිය දැනුවත් කරනවා. පොලීසිය යනකොට ඒ මිනිස්සු දුවනවා. පසුගිය දවස්වල එතන රණ්ඩුවකුත් වෙලා තියෙනවා.

ඊළඟට ළමා දිනය වෙනුවෙන් කරන්න ඕන කටයුත්ත මට ගිය සැරේ ළමා දිනය වෙලාවෙම හිතුනා. අපිත් හොඳ යහපත් දෙයක් ළමයින්ට කරන්න ඕන කියලා. අපේ ප්‍රාදේශීය සභාවෙ තමයි දරුවන් වැඩිපුර ප්‍රමාණයක්ඉන්නෙ. 400 ක් වගේ වගේ ළමයි ප්‍රමාණයක් ඉන්නවා. ඒ නිසා අලුත් මාදිලියේ නව නිර්මාණ ගෙන්නලා, දරුවන් විනෝද කරන්න තමයි අපි බලාපොරොත්තු වුණේ. ඒ අනුව අදාළ ආයතන සමඟ කතා කරනකොට, එයාල අපට සඳහන් කළේ, අපි කානිවල් එකක් කරන්නම්. ඒකෙදි අවසන් දිනයේදී දරුවන් වෙනුවෙන් සියලුම උපකරණ නොමිලේ ලබා දෙන්නම්. හැබැයි අපිව විනෝද බද්දෙන් නිදහස් කරන්න කියලා. මම ඒ වෙලාවේ ඒක හොයල බලන්නම් කියලා කිව්වා. පසුව මං ඒ ගැන හොයලා බලනකොට, විනෝද බද්ද අපට නිදහස් කරන්න හැකියාවක් නැහැ. ඒ අනුව අපි එයාලගෙන් විනෝද බදු ගන්නවා. ඒ එන සල්ලි අපිට දරුවන් වෙනුවෙන් වියදම් කරන්න පුළුවන්. නමුත් ඒ අතින් සල්ලි අරගෙන මෙ අතින් දෙන්න බැහැ. ඒ නිසා තමයි මුදල් වෙන් කර ගන්න ඕන. රුපියල් 150000.00 ක මුදල ප්‍රමාණවත් නොවන නිසා තව 150000.00 ක් සමග රු. 300000.00 ක මුදලක් වෙන් කර ගත්තේ. දරුවන් වෙනුවෙන් වියදම් කරාට, ඒ හා සමානවම අපට ආදායමක් එනවා. සමහර විට ඊට වඩා ආදායම අඩු වෙන්නත් පුළුවන්. නමුත් අපි දරුවෝ වෙනුවෙන්, ඒක කළ යුතුයි. අපේ වනිගරත්න මන්ත්‍රීතුමා සහ ජයවීර මන්ත්‍රීතුමා මේ කටයුත්තට විරුද්ධ වුණාට, අපි දරුවන්ට තෑග්ගකුත් දෙන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව වෙනදට වඩා විශේෂ විදියට, යම් වැඩපිළිවෙළක් කරන්න තමයි මේ මුදල් වෙන් කරගන්න ඕන කියලා කිව්වේ. අපේ ළමයි විනෝද වෙන්න එක එක ස්ථාන වලට අරන් යනවා. ඉතිං ඒ අවස්ථාව මෙහිදී ලබා ගන්න පුළුවන්. අපට ඕන්නං කිසි දෙයක් නොකර නිකන් ඉන්නත් තිබුණා. නමුත් ළමයි වෙනුවෙන් අපි යම් කිසි දෙයක් කරන්න ඕන නිසා අපි ඒ දේ කරනවා.

ඊළඟට ඉඩම් නඩු පිළිබඳව කතා කරද්දි, ගෝණදෙණියේ ඉඩම් නඩුවක් දාලා තියෙනවා. කාරියවසම් මහත්තයලා. රජයේ ඉඩමක් වුණාට එයාලා නීත්‍යානුකූලව අරගෙන තියෙන්නෙ. ඇප්තොප් වත්ත අයිති කරුණාරත්න කියන අයිතිකරුගෙන්ම තමයි මේ ඉඩම අරගෙන තියෙන්නෙ. ඉඩමේ ප්‍රමාණය අක්කර 1යි, රූඩ් 2යි පර්චස් 23 යි. සභාපතිතුමා, අපට පාර දෙන්න කියලා මාවත් වාචිකව දැනුවත් කළා. plan එකට අනුව අපේ ඉඩමෙනුත් කපලා තියෙනවා කියලා කිව්වා. මම ඒ අවස්ථාවේ කිව්වේ සභාවේ කතා කරලා උත්තරයක් දෙන්නම් කියලා. නමුත් ඒක වුණේ නැහැ. පසුව එයාල නඩු දාල තියෙනවා. දැන් ඒ නඩුවට අදාළව ක්‍රියාමාර්ග ගන්නවා. මේක කොයි විදියට වුණාද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා නීතිඥ මහත්තයාගෙන් අහලා අපි ඊට අනුකූලව කටයුතු කරමු. ඊට කලින් ඒ පිළිබඳව කාරියවසම් මහත්වරුන් සමග අපි වාචිකවත් කතා කරමු. මොකද අපට බැරෑරුම් ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වේවි. එතන ඉස්සරහා ඉඩම පහුගිය දවස්වල මැනීම් කටයුතු සිදුකළා. ඒ අදාළ නිලධාරීන් කියන විදියට, අක්කරයක ඉඩම් ප්‍රමාණයක් අපට තියෙනවා. එකෙ නඩුවටත් අපි ඉදිරිපත් වී ඉන්නෙ.

විශේෂයෙන්ම අපේ ධනංජය මන්ත්‍රීතුමා, සේවකයන්ගේ ප්‍රශ්න ගැන කතා කලා. මම මොන විදිහට කතා කරන්නද කියලා මට හිතාගන්න බැහැ. මොකද සේවකයෝ වැඩ කරන්නේ නැහැ. ඔබතුමා සැර කරන්නේ නැහැ. ඔබතුමා තදින් ඉන්නේ නැහැ කියලා කියන්නෙත් මන්ත්‍රීවරු. තදින් ඉන්න වෙලාවට තදින් ඉන්න එපා කියලා කියන්නෙත් ඔබතුමාලමයි. ඉතින් මම කාටවත් හිංසාවක්, පීඩාවක් වෙන්නෙ නැහැ. මම මනුස්සකමෙන් තමයි වැඩ කටයුතු කරන්නේ. නමුත් මනුස්සකමින් කියලා බැරි වුනහම මම ටිකක් සැර වෙනවා. ඒ වගේම ඇඟිලි මැෂින් සවි කිරීමට මට හිතුනේ වෙන ආයතනවල සවි කරපුවා දැනගෙන නෙවෙයි. පැමිණීම පිටවීම බලාගන්න ඕන නිසා. නමුත් වෙන ආයතනවලත් හැම ආයතනයකම වගේ මීට කලින් ඒ යන්ත්‍ර සවි කරල තියෙනවා. ඊළඟට දයානන්ද කියන සේවකයට මෙහේ ඇඟිලි සලකුණ තියන්න ඉඩදීලා තියෙන්නෙ. ඒ වගේම 4.45 ට පිටවීම තියෙන නිලධාරීන්ට සභාවේ සභාපතිතුමා හැටියට, පැය භාගයකට කලින් යන්න අවස්ථාව ලබා දෙන්න පුළුවන්. ඒකට ඉල්ලීමකුත් ඇවිල්ලා තිබුණා. ඒ වෙනුවෙන් මම එයාලට යථා කාලයේදී මෙම තීරණය වෙනස් වෙන්න පුළුවන් කියලා, කොන්දේසියක් දාලා ඒ අවසර ලබා දුන්නා.

ඊළඟට අපේ සභාවේ අඩුපාඩු තියෙනවා. ඒ අඩුපාඩු මැද්දෙ තමයි මේ සභාව ගෙනියන්නෙ. අපේ සභාවේ මේ කාල වකවානුව තුළ වැඩ කලේ නැතෙයි කියන්න බැහැ. වැඩ කළා. දැන් මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කතා කළා. පළමුවෙන්ම ස්තුති කරල තමයි මට බනින්නේ. වාටුවෙන් වැඩ කටයුතු කර ගෙන තමයි පස්සෙ බනින්නෙ. මට ඕන නම් නොකර ඉන්නත් පුළුවන්. ගරු මන්ත්‍රීතුමන්ලා ඔබතුමන්ලා කියනවා. අපේ අධීක්ෂණය යටතේ ඔබතුමන්ලාගෙත් පාරවල් යෝජනා කරන්න ඕන කියලා. එහෙම නීතියක් නැහැ. ගරු මන්ත්‍රීතුමා මේ සභාවට එන යෝජනා, සභාවේ සභාපති හරහා අපේ අවසරය නැතුව මොකුත් කරන්න බැහැ. ඉතින් ඒක නිසා ඔබතුමාලට ඕන විදියට නෙවෙයි. සභාවේ සභාපතිට ඕන විදියට කරන්නේ. මම මේ කියන්නේ වැරැද්දක් නෙවෙයි. ඔබතුමාලා වරදවා හිතපු නිසා. සභාවේ අවසර නැතුව කිසි පාරක් කරන්න බැහැ. එතකොට ඔබතුමාලගේ වැඩ කරන්නත් බැහැ. ඔබතුමාලට වැඩ කරන්නත් බැහැ. අපෙන් අවසර නැතුව පාරවල් යෝජනා කරන්නත් බැහැ. පාරවල් වලට සල්ලි ගෙනාපු එක හොඳයි. පුළුවන්නම් තවත් ගේන්න. නමුත් අපෙන් අවසර ගන්න ඕන. අනිත් සභාවන්වල සභාවෙන් තමයි ඇස්තමේන්තු සකස් කරන්නේ. අපේ බල ප්‍රදේශයේ සංවර්ධන වැඩවල සියළු කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමයි කරන්නෙ. අපේ අයවැය යෝජනාවලියෙන් කියන පාරවල් ටික මූලික කරගෙන කලානම් ඇත්තටම ලොකු බරක් අපේ සභාවෙන් අඩුවෙනවා. මේ පාර, මේ පාර කියලා ඔබතුමාලනේ යෝජනා දෙන්නෙ. නමුත් ඒ පාරවල් නෙවෙයි වෙන පාරවල් තමයි මේ සංවර්ධන යෝජනා සඳහා දීලා තියෙන්නෙ. එතන පොඩි වරදක් තියෙනවා. ඒක මේවත් එක්ක එකතු වෙලා කෙරෙනවනම් හොඳයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන්

මේවා කරන එක ලොකු දෙයක්. මොකද අපට තාක්ෂණ නිලධාරි දෙන්නයි ඉන්නේ. අපිට අපේ වැඩ කරගන්නත් අමාරුයි. මේ සභා බල ප්‍රදේශය තුල වැඩ කෙරෙනවා නම් සතුටු වෙන එකම මිනිහා මම කියන්න පුළුවන්. මොකද අපේ බර තමයි අඩුවෙන්නෙ.

ඒ වගේම අපේ ජයවීර මන්ත්‍රීතුමාගේ යෝජනා මම සැලකුවේ වාචික ප්‍රශ්ණ හැටියට. ඒවට මම ඔබතුමාට පිළිතුරු සපයන්නම්. අප බල ප්‍රදේශයේ වීථි ලාම්පු කීයක් තියෙනවද? කියලා අහල තිබුණා. මේ වෙනකොට 1257 ක් තියෙනවා. ඊළඟට විදුලිබල මණ්ඩලයෙන් එක වීථි ලාම්පුවකට නඩත්තු ගාස්තුව කීයක් ගෙවනවද? කියලා අහල තිබුණා. සාමාන්‍ය වීථි ලාම්පුවකට මසකට රුපියල් 37 ක මුදලක් ගෙවනවා. සී එෆ් එල් පහනකට මසකට රුපියල් 36 ක් ගෙවනවා. Mercury එකක් සඳහා මසකට රුපියල් 40.00 යි. Mercury vapor සඳහා මසකට රුපියල් 48.00 යි. Sodium vapor සඳහා මසකට රුපියල් 54.00 යි. මේ මුදල් වීථි පහන් 1257ට ම ගෙවන්නේ නැහැ. අපට අනුමත වෙලා තියෙන්නේ 243 යි. ඒ 243 ට විතරයි ගෙවන්නේ. අලුතින් අපට දාන්නත් බැහැ. ඒ නිසා විදුලි බල මණ්ඩලයට ඕන නම් වැඩිපුර තියෙන වීථි ලාම්පු ගලවා ගෙන යන්නත් පුළුවන්. වීථි පහනක් අවශ්‍ය තැනකට දාන්න උපාංග නැති වුනහම අපි කියනවා ගෙනත් දෙන්න අපි දාලා දෙන්නම් කියලා. ඒකෙ වගකීම අපි ගන්නවා. දැන් මේ වීථි ලාම්පු සේරම අනුමැතියට යවලා තියෙන්නේ. බොහෝදුරට අනුමත වෙලා එන්න පුළුවන් කියලා හිතනවා.

ඊළඟට වාහන පිළිබඳව අහල තිබුණා. අපේ සභාවේ ඩබල් කැබ් රථ දෙකක් තියෙනවා. දෙකම ධාවන තත්වයේ පවතිනවා. ට්‍රැක්ටර් හතරක් තියෙනවා. වාහන ඉන්වෙන්ට්‍රි ගතවෙලා තියෙනවා. ධාවන තත්වයේ දෙකක් තියෙනවා. ධාවන තත්වයේ නොමැති වාහන 02යි. ට්‍රැක්ටර් ට්‍රේලර් තුනයි. ධාවන තත්වයේ එකයි. ධාවන තත්ත්වයේ නැති එකයි. අපහරණ එකයි. අත්ට්‍රැක්ටර් එකයි. ඉන්වෙන්ට්‍රි ගතවෙලා තියෙනවා. ධාවන තත්වයේ තියෙනවා. හෑඩිමෙක් ට්‍රැක්ටර් එකයි. ඉන්වෙන්ට්‍රි ගතවෙලා තියෙනවා. ධාවන තත්වයේ නොමැත. ට්‍රේලර් බවුසර් තුනයි. ඉන්වෙන්ට්‍රිගත තුනයි. ධාවන තත්වයේ තුනයි. ට්‍රක් බවුසර් එකයි ඉන්වෙන්ට්‍රිගත එකයි. ධාවන තත්වයේ එකයි. ටිපර් රථ එකයි. ඉන්වෙන්ට්‍රිගත එකයි. ධාවන තත්වයේ එකයි. කෘ කැබ් රථ එකයි. ඉන්වෙන්ට්‍රි ගත එකයි. ධාවන තත්වයේ එකයි. බැකෝ යන්ත්‍ර එකයි. ඉන්වෙන්ට්‍රිගත එකයි. ධාවන තත්වයේ නැත. අපහරණය කළ යුතුය. මේ ඔබතුමා අහපු ප්‍රශ්න ටිකට පිළිතුරු. ඒ වගේම අපේ බල ප්‍රදේශයේ පොදු වැසිකිළි කීයක් තිබේද? කියලා ඇහුවා. එහෙම පොදු වැසිකිළි නම් නැහැ. මාපලගම බස් නැවතුම්පොලේ පොදු වැසිකිලිය ස්ථාපිත කරන්නේ කවදද? කියලා ඇහුවා. එක යථා කාලයේදී ස්ථාපිත වෙනවා. නැත්නම් එයට හේතුව අහල තිබුණා. හේතුව නම්, එතන එක් පුද්ගලයෙක් විරුද්ධ වෙලා ලක්ෂ 35 වැසිකිළිය ඉදි කරන්න බැරි වුණා. දැන් ලක්ෂ සීයක් ඇවිල්ලා තියෙනවා. ඒ කටයුත්ත යථා කාලයේදී සිදුවේවි. ඔබතුමාගේ ප්‍රශ්න වලට පිළිතුරු තමයි මම දුන්නේ. ඒවා න්‍යායපත්‍රයට දාලා කරන්න ඕන කටයුත්තක් නෙවෙයි. මොකද මේ ප්‍රශ්න වාචික ප්‍රශ්ණ නිසා.

අද මම බොහොම සතුටු වෙනවා. අවසාන වෙනකම් අපේ ජයවීර මන්ත්‍රීතුමා සභාව තුල රැඳී සිටීම පිළිබඳව. මම හිතන්නේ පලවෙනි වතාවට අද තමයි රැස්වීම ඉවර වෙනකම් හිටියේ. අද තරංග මන්ත්‍රීතුමා නැහැ. අද කාලවේලාව ඉක්ම ගියා. බොහොම හොඳ සාකච්ඡා සිදුවුණා. මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලන්නේ, අපේ පෞද්ගලික ප්‍රශ්න, පෞද්ගලික මතිමතාන්තර නෙවෙයි, යහපත් දේ කතා කරලා, කටයුතු කරන්න. ඒ වගේම මාධ්‍යවේදීන් නොපැමිණීම සම්බන්ධව, මම මාධ්‍යවේදීන් දැනුවත් කරලා තියෙන්නේ. බොහෝ දුරට එතුමන්ලට ස්ථානගත වෙන්න ස්ථානයක් නොමැති කම ඔවුන්ගේ නොපැමිණීමට බොහෝ දුරට බලපානවා. එහෙමනම් අපි මාධ්‍යවේදීන්ට දීමනාවක් ගෙවමු. එහෙම ගෙවල හරි සභා රැස්වීම කැඳවා ගමු. අද වෙලාවට මාධ්‍යවේදීන් ආවේ නැත්තේ. නැත්නම් දහනම වෙනි වතාවටත් අර ආච්චි අම්මා කියලා පත්තරේ පළ වේවි. ඒ පිළිබඳව වර්තමාන තත්වය, ඉඩම පිළිබඳ අයිතිය බලාගත්තේ අද තමයි. ඒ ඉඩම LRC එකේ. අපි LRC එකට ලියුම දානවා.

කොහොම නමුත් මාසයක් ඇතුළත ඒ කටයුත්ත ඉටු කරන්න අප බලාපොරොත්තු වෙනවා. ඇත්ත කතාව නම්, ඒ ගහ කපන්න අවශ්‍ය කටයුතු කරන්න අපට බැහැ. ඒ මුදල් අපට ලබාගන්න බැහැ. නැත්නම් සභාවෙන් සල්ලි දීලා, කාටහරි කියලා, මට ඒ ගහ කප්පවන්න තිබුණා. මම ඒ කටයුත්ත යම් ක්‍රමවේදයකට කරලා අපෙත් ඇඟ බේරගෙන ඒ වැඩේ කරන්න තමයි බලාපොරොත්තු වුනේ. අන්න ඒ වගේ ගොඩක් අපහසුතාවෙන් තමයි අපි සභාවේ වැඩ කටයුතු කරගෙන යන්නේ.

ඔය හැමදේටම වඩා මම මේ දවස් වල ආදාහනාගාරය ඉදි කිරීමේ කටයුත්ත ගැන අවධානය යොමුකරලා තියෙනවා. එහෙම නැත්නම් අපට නොමිලේ ලැබුණු සල්ලි ටිකත් අපතේ යාවි. ආපසු අපට ඒක කරගන්න අපහස තත්වයට පත්වේවි. ඒ නිසා විශේෂයෙන්ම මේ සඳහා ඔබතුමාලගේ සහයෝගයත් අවශ්‍ය වෙනවා. ඒ වගේම වැළි පළවල් ගැන කතා කරහම, අපේ ගයාන් මන්ත්‍රීතුමා, නැවත මතක් කරනවා. ඔය වැලි පොළට අපේ කිසිම සම්බන්ධයක් නැහැ. මම ප්‍රාදේශීය ලේකම්ගෙන් ඇහුවා. බලපත්‍රයක් නැහැ. ගයාන් මන්ත්‍රීතුමා කිව්වම තමයි දන්නේ නැවත වැඩ කරන බව. ඒ වගේම වතුර ප්‍රශ්නයි, පස් කපන ප්‍රශ්නයි අපි දැනගන්නේ අපිට complain එකක් ආවට පස්සේ.

අවසාන වශයෙන් ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණේ ජනාධිපතිධුර අපේක්ෂක ලෙස අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා පත්කරලා තියෙනවා. එතුමාගේ ජයග්‍රහණය පතා අපි සියලු දෙනා එක් වෙලා වැඩ කටයුතු කරමු කියලා සියලු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. තිස් අවුරුදු යුද්ධය නිමා කරමින් අපි කවුරුත් එක්ක එකතුවෙලා තමන්ගේ සහෝදර ප්‍රේමයෙන් නායකත්වයට ගරු කරමින් කටයුතු කරපු එකම පුද්ගලයා එතුමාට අපේ ගරුත්වයක් තියෙන්නේ, වැටහීමක් තියෙන්නෙ, එතුමා දක්ෂ ක්‍රියාශීලී නායකයෙක් නිසා. අපි ආසයි රට ලස්සනට තියෙනවට. ඒ නිසා එතුමා බොහොම වෙහෙස මහන්සි වෙලා, තරුණ ජවය උපයෝගී කරගෙන වැඩ කටයුතු කළා. ඒ නිසයි අපි එතුමට ආදරේ. එතුමා දේශපාලකයෙක් හැටියට අපි දන්නේ නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා එතුමාගේ නායකත්වයෙන්, ඉදිරියේ රට ස්වයංපෝෂිත, ලස්සන පිරිසිදු ඉන්දියන් සාගරයේ මුතු ඇටය වෙන්න කියලා ප්‍රාර්ථනා කරමින්, අද සභා රැස්වීමට සහභාගී වූ උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලාට මාගේ ස්තූතිය පුද කරමින් අද සභා වාරය මෙතෙකින් නිම කරමින්, මම නිහඬ වෙනවා. සියලු දෙනාටම ජය වේවා!

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                                        දිනය:- .............................